# 2022 ඔක්තොම්බර් 11

# මහා සභා රැස්වීමේ වාර්තාව

# දෙහිඹිවිට ප්‍රාදේශීය සභාව

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 ඔක්තොම්බර්

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.10.11 වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 ඔක්තොම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සභාගිත්වය:

1. ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. අමිල කන්දෙආරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. එච්.අමරාවතී මැතිණිය -ගරු ප්රාදේශිය සභා මන්ත්‍රීනී
9. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
10. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
14. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
15. දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
16. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
18. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
19. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
21. අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
23. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
24. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
25. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
26. එම්.වී.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
27. ආර්.පී.ශ්‍රියානි ජයකොඩි මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
28. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
29. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
30. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
31. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
32. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
33. කෝසල නුවන් ජයවීර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
34. එච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

කාර්යාල නිලධාරීන්:

I  එම්.ඩී.සී.රුක්ෂානි මිය - ලේකම්
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III එම්.ජී.ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.09.06 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.09.06 වෙනි දින පවත් වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැතිනම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

2022.09.06 වෙනි දින පැවති මහා සභා රැසවීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.09.06 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන:**

**(ඇ)** ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ජාතික ජලසම්පාදන මණ්ඩලය මගින් ජලනල එලීම සඳහා පළුදු කරන ලද මාර්ග යථා තත්වයට පත් කිරීමට අදාලව නාපාවල යාලගම අතුරු මාර්ගයේ ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කළද එම ස්ථාන යථා තත්වයට පත් කිරීමට නොහැකි වූ බවත් පසු ගිය දිනවල පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් අදාල කොන්ත්‍රාත්කරු එම කාර්ය අතර මග නවතා දැමූ බැවින් නව කොන්ත්‍රාත්කරුවෙකු යටතේ කඩිනමින් එම කාර්ය අවසන් කරන බව දක්වා එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**(ඇ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

01. 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ

i. මධ්‍යස්ථ අඩු බර දරුවන් කොපමණ සිටීද ?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

255

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ii . උග්‍ර අඩු බර දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

37

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

iii. MAM දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔක්තොම්බර් මස අවසානයේ ගණනය කිරීම් සිදු කරනු ලබයි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

iv. SAM දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔක්තොම්බර් මස අවසානයේ ගණනය කිරීම් සිදු කරනු ලබයි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

v . නීරක්තිය ඇති ගැබිණි මව්වරුන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

60

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

vi . BMI අගය 18.5 අඩු ගැබිණි මවුවරුන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

40

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

02. 42022 වර්ෂයේ දෙවන කාර්තුව තුළ දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ

i. මධ්‍යස්ථ අඩු බර දරුවන් කොපමණ සිටීද ?

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

254

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ii. උග්‍ර අඩු බර දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

45

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

iii . MAM දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔක්තොම්බර් මස අවසානයේ ගණනය කිරීම් සිදු කරනු ලබයි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

iv . SAM දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔක්තොම්බර් මස අවසානයේ ගණනය කිරීම් සිදු කරනු ලබයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

v . නීරක්තිය ඇති ගැබිණි මව්වරුන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

60

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

vi . BMI අගය 18.5 අඩු ගැබිණි මවුවරුන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

24

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

03. 2022 වර්ෂයේ තුන් වන කාර්තුව තුළ දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ

i. මධ්‍යස්ථ අඩු බර දරුවන් කොපමණ සිටීද ?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

192

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ii. උග්‍ර අඩු බර දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

31

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

iii **.** MAM දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔක්තොම්බර් මස අවසානයේ ගණනය කිරීම් සිදු කරනු ලබයි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

iv . SAM දරුවන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඔක්තොම්බර් මස අවසානයේ ගණනය කිරීම් සිදු කරනු ලබයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

v . නීරක්තිය ඇති ගැබිණි මව්වරුන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

42

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

vi . BMI අගය 18.5 අඩු ගැබිණි මවුවරුන් කොපමණ සිටීද?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

12

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i)** **ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යයන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.09.21 වෙනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යයන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 සැප්තැම්බර් මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

ඇමුණුම
අංක 02

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

### 2022 සැප්තැම්බර් මස 30 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| සැප්:01 | 1330 | පෝස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්රා යන්ත්‍රයට ගාස්තු ඇතුලත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,000.00 |
| සැප්:01 | 1331 | දාස මෝටර්ස්<br>PF7369 දරණ කැබ් රථයේ ඉදිරිපස දෙපැත්ත බ්‍රේක් පෑඩ් ගලවා සවිකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,200.00 |
| සැප්:01 | 1332 | දාස මෝටර්ස්<br>RD9461 දරණ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 31,900.00 |
| සැප්:01 | 1333 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස 42-7498 දරණ ගිලන්රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,200.00 |
| සැප්:01 | 1334 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස RC-1403 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 38,720.00 |
| සැප්:01 | 1335 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස QU2004 දරණ ත්‍රීවිලරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,680.00 |
| සැප්:01 | 1336 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස RE-2258 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 35,200.00 |
| සැප්:01 | 1337 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස 250-4053 දරණ කැබ්රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 11,050.00 |
| සැප්:01 | 1338 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස බොබ්කැට් යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 40,000.00 |
| සැප්:01 | 1339 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස LF-4836 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 27,780.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:01 | 1340 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස RD-6541 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,200.00 |
| සැප්:01 | 1341 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස QU2004 දරණ ත්‍රීවිලරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 21,460.00 |
| සැප්:01 | 1342 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස ආදාහනාගාරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම.(විදුලි ජනක යන්ත්‍රය) | 8,000.00 |
| සැප්:01 | 1343 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස ගල්රෝල් සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,400.00 |
| සැප්:01 | 1344 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස 250-4053 දරණ කැබ්රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 31,230.00 |
| සැප්:01 | 1345 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>RC-1403 දරණ ට්‍රැක්ටරය සේවා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 23,165.00 |
| සැප්:01 | 1346 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>RE-2258 දරණ ට්‍රැක්ටරය සේවා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 24,990.00 |
| සැප්:01 | 1347 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 ජූලි මස බිල්පත ගෙවීම. | 8,034.26 |
| සැප්:01 | 1348 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 ජූලි මස බිල්පත ගෙවීම. | 845.71 |
| සැප්:01 | 1349 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 ජූලි මස බිල්පත ගෙවීම. | 9,123.25 |
| සැප්:01 | 1350 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 ජූලි මස බිල්පත ගෙවීම. | 845.71 |
| සැප්:01 | 1351 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 ජූලි මස බිල්පත ගෙවීම. | 845.71 |
| සැප්:01 | 1352 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 ජූලි මස බිල්පත ගෙවීම. | 845.71 |
| සැප්:01 | 1353 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/07/14 සිට 2022/08/13 දක්වා බිල්පත ගෙවීම. | 697.50 |

| | | | |
|---|---|---|---|
| සැප්:01 | 1354 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.3612082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2022/07/14 සිට 2022/08/15 දක්වා බිල්පත ගෙවීම. | 276.60 |
| සැප්:01 | 1355 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/108/17 දරණ තල්දුව සතිපොළේ ජල බිල්පත කාර්යාලයේ 2022/07/08-2022/08/07 දක්වා බිල්පත ගෙවීම. | 13,414.43 |
| සැප්:01 | 1356 | සිසිරඹ හෝල්ඩින්ස් (පුද්) සමාගම<br>බොබ්කැට් යන්ත්‍රයේ ඉදිරිපස බකට් එක අලුතින් තහඩු යොදා සම්පූර්ණ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 290,000.00 |
| සැප්:05 | 1357 | අයි.ටී.විජේතුංග<br>දෙ/ප්‍රා/සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු කාර්මික නිලධාරී මයාට 2022 අගෝස්තු මස දීමනාව ලබා දීම. | 38,199.00 |
| සැප්:05 | 1358 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>හරස් සටහන් මඟින් 2235101 දරණ ගිණුමට බැරව ඇති උත්සව හා විශේෂ අත්තිකාරම් මුදල් 2235105 දරණ ගිණුමට බැර කිරීම. | 282,672.68 |
| සැප්:05 | 1359 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>ගෙවතු වගා වැඩසටහන සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 42,562.00 |
| සැප්:05 | 1360 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබාගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| සැප්:06 | 1361 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 සැප්තැම්බර් මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 795,000.00 |
| සැප්:06 | 1362 | මු.හා.ක-එස්.පී.තිලකරත්න<br>ගමන් වියදම් ගෙවීම. | 984.00 |
| සැප්:06 | 1363 | මු.හා.ක-ඒ.ආර්.ඩී.එම්.බණ්ඩාර<br>දෙ/ප්‍රා/සභාවේ කාර්යාලීය අවශ්‍යතා සඳහා සකස් කල නිල මුද්‍රා 04 සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 1,900.00 |
| සැප්:06 | 1364 | මු.හා.ක-ඩබ්.ඩී.එස්.සී.රණසිංහ<br>250-4053 කැබ් රථය සඳහා අවිස්සාවේල්ල කේ.ඩී.පී.අර්සකුලරත්න සහ පුත්‍රයෝ ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,900.00 |
| සැප්:06 | 1365 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>ගමන් වියදම් ගෙවීම. | 1,412.40 |
| සැප්:06 | 1366 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>PF7369 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ගෙවීම. | 3,100.00 |
| සැප්:06 | 1367 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද<br>ගමන් වියදම් ගෙවීම. | 9,500.00 |
| සැප්:06 | 1368 | මු.හා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන<br>ගමන් වියදම් ගෙවීම. | 4,720.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:06 | 1369 | මු.භා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| සැප්:06 | 1370 | මු.භා.ක-ගයාන් නිලන්ත<br>මිනුම් ටේප් එකක් ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 1,620.00 |
| සැප්:06 | 1371 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222315 දරණ කාර්යාලීය දුරකථනයේ 2022/07/16-2022/08/15 දක්වා බිල්පත ගෙවීම. | 2,110.28 |
| සැප්:06 | 1372 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ඊරියගොල්ල ආදාහනාගාරයේ 036-3868934 දරණ දුරකතනයේ 2022/07/16-2022/08/15 දක්වා බිල්පත ගෙවීම. | 524.42 |
| සැප්:06 | 1373 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6316208308 දරණ දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/07/15-2022/08/13 දක්වා බිල්පත ගෙවීම. | 2,070.00 |
| සැප්:06 | 1374 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 2692684915 දරණ පනාවල මහජන පුස්තකාලයේ 2022/07/29-2022/08/26 දක්වා බිල්පත ගෙවීම. | 516.90 |
| සැප්:06 | 1375 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/07/18-2022/08/17 දක්වා බිල්පත ගෙවීම. | 843.90 |
| සැප්:06 | 1376 | ඊ.ඩබ්.සුගතදාස<br>සෞඛ්‍ය අංශයේ අවශ්‍යතාවය සඳහා ඉදල් 20ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,000.00 |
| සැප්:06 | 1377 | එස්.ඒ.එස්.ටී.පෙරේරා<br>2022/07/21 මානියම්ගම පැවති ඩෙංගු වැඩසටහනේ සංග්‍රහ වියදම් ගෙවීම. | 1,725.00 |
| සැප්:06 | 1378 | කේ.එම්.එස්.ඔටෝ කෙයා<br>LL7582 දරණ කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 අගෝස්තු) | 31,935.00 |
| සැප්:06 | 1379 | කේ.එම්.එස්.ඔටෝ කෙයා<br>LF4836 දරණ කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 28,960.00 |
| සැප්:06 | 1380 | කොලොන්න සර්විස් සෙන්ටර්<br>බොබ්කැට් යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 32,240.00 |
| සැප්:07 | 1381 | අටුළුගම උතුර ග්‍රාම සංවර්ධන සමිතිය<br>දීගල හන්දිය සෞඛ්‍ය ජනපද මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම. | 97,105.03 |
| සැප්:07 | 1382 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 අගෝස්තු මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 854,637.91 |
| සැප්:08 | 1383 | ගුරුගල්ල ග්‍රාම සංවර්ධන සමිතිය<br>පින්නපොල ඇතුල් මාර්ගයේ දේවින්ද මයාගේ නිවස අසල සිට ශ්‍රියාලතා මියගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම 30% රැඳවුම් ගෙවීම. | 148,500.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:08 | 1384 | සී/ස දැරණියගල පනාවල විවිධ සේවා සමූපකාර සමිතිය<br>පින්නපොල ඇතුල් මාර්ගයේ චන්දි මියගේ වෙළඳසැල අසලින් සරත් මයාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම 10% රැඳවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| සැප්:08 | 1385 | සී/ස දැරණියගල පනාවල විවිධ සේවා සමූපකාර සමිතිය<br>නාහැල්ම මාර්ගයේ කොන්ක්‍රීට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට සංවර්ධනය කිරීම 10% රැඳවුම් මුදල් ගෙවීම. | 49,279.44 |
| සැප්:09 | 1386 | මෙත්තා වැඩිහිටි සමිතිය-මාගම්මන<br>පහළ දයිගල ජයන්ති මාර්ගයේ චූලනී මයාගේ නිවස අසල සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීම 10% රැඳවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| සැප්:09 | 1387 | මු.හා.ක-කේ.ජී.සී.වෙරෝනිකා ගම ඇතිගේ<br>2022 අගෝස්තු මස පෙර පාසැල් දීමනා ගෙවීම. | 15,000.00 |
| සැප්:09 | 1388 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 අගෝස්තු මස මුදල් ගෙවීම. | 85,200.00 |
| සැප්:09 | 1389 | ඊරියගොල්ල ග්‍රාම සංවර්ධන සමිතිය<br>රූකාෂල් මැටිවල හන්දියේ සිට බඹරගල මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම. | 97,200.83 |
| සැප්:09 | 1390 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ ජූලි මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,250.00 |
| සැප්:09 | 1391 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ ජූලි මස තල්දූව මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,250.00 |
| සැප්:09 | 1392 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ ජූලි මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,260.00 |
| සැප්:09 | 1393 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ ජූලි මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,800.00 |
| සැප්:09 | 1394 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ක්‍රීඩා පිටිය කුලියට ලබාදීම වෙනුවෙන් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 5,000.00 |
| සැප්:09 | 1395 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>ගමන් වියදම් ගෙවීම. | 4,500.00 |
| සැප්:09 | 1396 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවය වෙනුවෙන් දීමනා ගෙවීම. | 4,713.00 |
| සැප්:09 | 1397 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න<br>2022 ජූලි මස ගමන් වියදම් ගෙවීම. | 2,100.00 |
| සැප්:09 | 1398 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ නිශ්පාදිත කාබනික පොහොර සඳහා එහි සේවකයන්ට දිරි දීමනා ලබාදීම. | 9,360.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:09 | 1399 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>2022/08/23 දින පැවති පරිසර කමිටුවේ සංග්‍රහ වියදම් ගෙවීම. | 1,800.00 |
| සැප්:12 | 1400 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022/04/26,05/17,06/23,07/28,08/26 යන දිනයන්හි සැලසුම් කමිටු දීමනා ගෙවීම. | 31,500.00 |
| සැප්:12 | 1401 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්<br>2022 වර්ෂයේ අප්‍රේල්,මැයි,ජූනි යන මාස සඳහා විශ්‍රාම වැටුප් දායක බිල්පත් ගෙවීම. | 10,334.79 |
| සැප්:12 | 1402 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2022 වර්ෂයේ I වන කාර්තුව සඳහා අයකර ඇති මුද්දර බදු ගාස්තු දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට ප්‍රේෂණය කිරීම. | 49,609.00 |
| සැප්:12 | 1403 | ආසිරි එන්ප්‍රයිසස්<br>තල්දූව සතිපොළ වෙළඳ කඩකාමර වල වහල අලුත්වැඩියා කිරීම සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 15,811.00 |
| සැප්:12 | 1404 | නලීන් මෝටර්ස්<br>PF7369 අංක දරණ කැබ් රථය සඳහා බ්‍රේක් පෑඩ් 02ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,400.00 |
| සැප්:12 | 1405 | ගුරුගේ සර්විස් සෙන්ටර්<br>QU2004 දරණ ත්‍රීවිල්රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,350.00 |
| සැප්:12 | 1406 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2022/08/02-2022/09/06 දක්වා බිල්පත ගෙවීම. | 2,166.50 |
| සැප්:12 | 1407 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6321102601 දරණ පනාවල පෙර පාසැල් නව ගොඩනැගිල්ලේ 2022/07/29-2022/08/26 දක්වා බිල්පත ගෙවීම. | 441.30 |
| සැප්:12 | 1408 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරණ ඊරියගොල්ල ආදාහනාගාරයේ 2022/07/29-2022/08/29 දක්වා බිල්පත ගෙවීම. | 3,863.40 |
| සැප්:13 | 1409 | එච්.කේ.ආර්.පී.ජයසේකර<br>QU2004 ත්‍රීවිල් රථයට අලුතින් එන්ජින් මවුන්ට් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,090.00 |
| සැප්:13 | 1410 | එක්සත් ගොවි සංවිධානය-ඉහළ දයිගල<br>කුරුපැත්ත රම්‍යා මියගේ නිවස අසලින් ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රඳවුම් ගෙවීම. | 10,000.00 |
| සැප්:13 | 1411 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 11,250.00 |
| සැප්:13 | 1412 | මු.හා.ක-එස්.පී.තිලකරත්න<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 6,017.00 |
| සැප්:13 | 1413 | මු.හා.ක-එච්.පී.පී.එස්.කුමාර<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 12,095.00 |
| සැප්:13 | 1414 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න<br>2022 අගෝස්තු මස ගමන් වියදම් ගෙවීම. | 3,150.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:13 | 1415 | මු.හා.ක-එච්.ඒ.සී.ඩබ්.හේනකආරච්චි<br>නිවාස හා ප්‍රජාකාරක සභාවේ සංග්‍රහ වියදම් ගෙවීම. | 1,560.00 |
| සැප්:13 | 1416 | මු.හා.ක-එච්.ඒ.ශ්‍යාමනී<br>ගමන් වියදම් ගෙවීම. | 1,340.00 |
| සැප්:13 | 1417 | මු.හා.ක-එච්.ඒ. ශ්‍යාමනී<br>ගමන් වියදම් ගෙවීම. | 1,020.00 |
| සැප්:13 | 1418 | මු.හා.ක-එච්.ඒ. ශ්‍යාමනී<br>ගමන් වියදම් ගෙවීම. | 1,020.00 |
| සැප්:13 | 1419 | මු.හා.ක-එච්.ඒ. ශ්‍යාමනී<br>ගමන් වියදම් ගෙවීම. | 1,020.00 |
| සැප්:13 | 1420 | මු.හා.ක-එච්.ඒ. ශ්‍යාමනී<br>ගමන් වියදම් ගෙවීම. | 1,020.00 |
| සැප්:13 | 1421 | මු.හා.ක-ඩබ්.ඒ.ඩී.කොඩිකාර<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 839.00 |
| සැප්:15 | 1422 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>2022/08/09 දින පැවති මහාසභා රැස්වීමේ සංග්‍රහ සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 7,590.00 |
| සැප්:15 | 1423 | පෝස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්‍රා යන්ත්‍රයට ගාස්තු ඇතුලත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,000.00 |
| සැප්:15 | 1424 | වී.බී.සී.ධර්මසේන<br>සැලසුම් කමිටු දීමනා ලබාදීම. | 5,250.00 |
| සැප්:15 | 1425 | එච්.කේ.එම්.එච්.එන්.විජේරත්න<br>සැලසුම් කමිටු දීමනා ලබාදීම. | 5,250.00 |
| සැප්:15 | 1426 | එච්.කේ.එම්.එච්.එන්.විජේරත්න<br>ගමන් වියදම් ගෙවීම. | 3,682.00 |
| සැප්:15 | 1427 | නිපෝන් හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>මාර්ග කම්කරුවන්ගේ වීසිකැති මුවහත් කිරීම සඳහා ලබාගත් පීර වෙනුවෙන් මුදල් ගෙවීම. | 550.00 |
| සැප්:15 | 1428 | නිපෝන් හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>ඉබියතුරු කට්ටලයක් ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,060.00 |
| සැප්:15 | 1429 | නිපෝන් හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>මාගම්මන පුස්තකාලයේ අක්‍රීය වූ ගේට්ටුව අලුත්වැඩියා කිරීම සහ ට්‍රැක්ටර් රථවල අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් ලබාගත් ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවීම. | 7,700.00 |
| සැප්:15 | 1430 | සී.එම්.පී.රුවන්කුමාර<br>කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් ගෙවීම. | 2,670.00 |
| සැප්:15 | 1431 | එල්.එම්.ඩී.දමයන්ති විජේසිංහ<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 2,640.00 |
| සැප්:15 | 1432 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව<br>ආදාහනාගාර ක්‍රියාකරු එම්.ආර්.පී.කුමාරසිරි මයාගේ ජීවිත රක්ෂණය සඳහා දායක මුදල් ගෙවීම. | 10,274.93 |

| | | | |
|---|---|---|---|
| සැප්:15 | 1433 | මු.හා.ක-එච්.ජී.දේශප්‍රිය<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 10,639.00 |
| සැප්:15 | 1434 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 2,643.00 |
| සැප්:15 | 1435 | මු.හා.ක-ඒ.ඩබ්.ජේ.එස්.සෝමවීර<br>පාසැල් රග්බි තරගය සඳහා ගිලන් රථය ලබාදීම හේතුවෙන් රියදුරු දීමනාව ලෙස පාසැල් මඟින් අයකරගන්නා ලද තැන්පත් මුදල් රියදුරු සඳහා ගෙවීම. | 2,800.00 |
| සැප්:16 | 1436 | සී/ස ලංකා පොස්පේට් සමාගම<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ කාබනික පොහොර නිපදවීම සඳහා පොස්පේට් මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 15,800.00 |
| සැප්:16 | 1437 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දූව පොදු වෙළද සංකීර්ණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 අගෝස්තු සඳහා) | 156,136.31 |
| සැප්:16 | 1438 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 2,952.00 |
| සැප්:16 | 1439 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 8,166.00 |
| සැප්:16 | 1440 | මු.හා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 8,411.00 |
| සැප්:16 | 1441 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 2,233.00 |
| සැප්:16 | 1442 | මු.හා.ක-ඩී.එල්.ආර්.එස්.කුමාර<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 6,445.00 |
| සැප්:16 | 1443 | මු.හා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන<br>ගමන් වියදම් ගෙවීම. | 3,540.00 |
| සැප්:20 | 1444 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/265/16 දරණ තල්දූව පුස්තකාලයේ 2021/11/03-2022/09/06 දක්වා බිල්පත් ගෙවිම. | 5,280.87 |
| සැප්:20 | 1445 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/08/05-2022/09/04 දක්වා බිල්පත ගෙවිම. | 7,536.29 |
| සැප්:20 | 1446 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/08/05-2022/09/04 දක්වා බිල්පත ගෙවිම. | 649.83 |
| සැප්:20 | 1447 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/08/04-2022/09/03 දක්වා බිල්පත ගෙවිම. | 3,719.26 |
| සැප්:20 | 1448 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/08/09-2022/09/09 දක්වා බිල්පත ගෙවිම. | 352.72 |

| | | | |
|---|---|---|---|
| සැප්:20 | 1449 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/067/174/14 දරණ ඊ/ආදාහනාගාරයේ 2022/07/23-2022/08/23 දක්වා බිල්පත ගෙවිම. | 147.25 |
| සැප්:20 | 1450 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/07/26-2022/08/25 දක්වා බිල්පත ගෙවිම. | 372.96 |
| සැප්:20 | 1451 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 868.37 |
| සැප්:20 | 1452 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 868.37 |
| සැප්:20 | 1453 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 868.37 |
| සැප්:20 | 1454 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 868.37 |
| සැප්:20 | 1455 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 8,249.47 |
| සැප්:20 | 1456 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 9,219.18 |
| සැප්:20 | 1457 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.7905151905 දරණ තල්දූව සතිපොළේ 2022/06/21 සිට 2022/08/22 දක්වා බිල්පත ගෙවීම. | 30,025.02 |
| සැප්:20 | 1458 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7970101003 දරණ දෙ/නව ප්‍රා/සභා කාර්යාලයේ 2022 අගෝස්තු මස බිල්පත ගෙවීම. | 62,731.16 |
| සැප්:20 | 1459 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7921106404 දරණ දෙ/ම/පුස්තකාලයේ(E-library) 2022/08/12-2022/09/14 දක්වා බිල්පත ගෙවීම. | 1,110.00 |
| සැප්:21 | 1460 | ජී.ටී.එස්.ධර්මවර්ධන<br>ග්ලවුස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 14,000.00 |
| සැප්:21 | 1461 | සහන වැඩිහිටි සමිතිය-පහළ තල්දූව<br>තල්දූව විද්‍යාල මාවතේ ගඟපාර සංවර්ධනය කිරීම කර්මාන්තයේ 30% රැඳවුම් මුදල් ගෙවීම. | 148,224.69 |
| සැප්:21 | 1462 | සහන වැඩිහිටි සමිතිය-පහළ තල්දූව<br>වත්තෙකඩේ සිට කිරිඅම්මලා කන්ද පාර සංවර්ධනය කිරීම කර්මාන්තයේ 30% රැඳවුම් මුදල් ගෙවීම. | 148,216.33 |
| සැප්:21 | 1463 | මු.හා.ක-යූ.ඩී.එස්.එම්.ආරියසිංහ<br>ගමන් වියදම් ගෙවීම. | 1,988.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:21 | 1464 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 4,708.00 |
| සැප්:21 | 1465 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>JX2221 යතුරුපැදිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 950.00 |
| සැප්:21 | 1466 | මු.හා.ක-ඩබ්.එස්.කේ.වර්ණපුර<br>මාර්ග සිතියම්ගත වැඩමුළුව සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 50,000.00 |
| සැප්:22 | 1467 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 සැප්තැම්බර් මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,370,170.81 |
| සැප්:22 | 1468 | වයි.එන්.පී.ට්‍රාන්ස්පෝර්ට් සර්විස්<br>දිගලවත්ත ප්‍රිමික්ස් අංගනය සඳහා ගංගා වැලි කියුබ් 01ක් මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,000.00 |
| සැප්:22 | 1469 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 89,720.00 |
| සැප්:22 | 1470 | පෝස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්‍රා යන්ත්‍රයට ගාස්තු ඇතුලත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,000.00 |
| සැප්:26 | 1471 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>තල්දූව සතිපොළ භූමිය සංවර්ධනය කිරීම අදියර 02 පලමු සහ දෙවන බිල්පත්හි අවසන් ගෙවීම. | 1,078,127.49 |
| සැප්:26 | 1472 | ලංකා ඉන්දියන් ඔයිල්<br>ඉන්ධන පිරවුම්හල ඉදිකිරීමට අදාළ අයදුම්පත්‍ර ගාස්තු ගෙවීම. | 10,000.00 |
| සැප්:28 | 1473 | සහන වැඩිහිටි සමිතිය-පහළ තල්දූව<br>කිරිඅම්මලා කන්ද ආරියවංශ නාහිමි මාවතේ දුශ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම 30% රඳවුම් මුදල් ගෙවීම. | 142,237.03 |
| සැප්:28 | 1474 | සහන වැඩිහිටි සමිතිය-පහළ තල්දූව<br>සුගතාරාම මාර්ගයේ දුශ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම 30% රඳවුම් මුදල් ගෙවීම. | 146,456.66 |
| සැප්:28 | 1475 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>ඉහළ තල්දූව බොරළුවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ගෙවීම. | 43,815.24 |
| සැප්:28 | 1476 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 26,500.00 |
| සැප්:28 | 1477 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස JCB යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 59,400.00 |
| සැප්:28 | 1478 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස PF-7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 22,000.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:28 | 1479 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස LF7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,160.00 |
| සැප්:28 | 1480 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස LL7582 දරණ කෘකැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 47,960.00 |
| සැප්:28 | 1481 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස RD-8018 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 51,040.00 |
| සැප්:28 | 1482 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූලි මස RD-5928 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 41,360.00 |
| සැප්:28 | 1483 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>42-7498 අංක දරණ ගිලන් රථයට 95m අමරොන් බැටරියක් ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 59,500.00 |
| සැප්:28 | 1484 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින් ට්රේඩින්<br>RA7673 ට්‍රැක්ටරයේ ටයර් හා ටියුබ් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,800.00 |
| සැප්:28 | 1485 | දෙහිඕවිට ටයර් ට්රේඩින්<br>QU2004 ත්‍රීවිල් රථයේ ටයර් පැති මාරුකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 400.00 |
| සැප්:28 | 1486 | දෙහිඕවිට ටයර් ට්රේඩින්<br>බොබ්කැට් යන්ත්‍රයේ ටයර් හා ටියුබ් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,400.00 |
| සැප්:28 | 1487 | දෙහිඕවිට ටයර් ට්රේඩින්<br>42-7498 අංක දරණ ගිලන් රථයේ වම්පස රෝදයේ පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 500.00 |
| සැප්:28 | 1488 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2022/09/06 දින පැවති මහාසභාවේ සංග්‍රහ කටයුතු සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 9,970.00 |
| සැප්:28 | 1489 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2022/07/12 දින පැවති මහාසභාවේ සංග්‍රහ කටයුතු සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 814.00 |
| සැප්:28 | 1490 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2022/06/07 දින පැවති මහාසභාවේ සංග්‍රහ කටයුතු සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 1,800.00 |
| සැප්:28 | 1491 | කේ.කේ.ඒ.ආර්.කුමාරසිංහ<br>දෙහිඕවිට ප්‍රා/සභාවේ වාහන සඳහා 2022 අගෝස්තු මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 645,332.00 |
| සැප්:30 | 1492 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් 250-4053 හා QU2004 දරණ ත්‍රීවිල් රථය සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 12,000.00 |

| | | | |
|---|---|---|---|
| සැප්:30 | 1493 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>JCB යන්ත්‍රය සඳහා හයිඩොලික් ඔයිල් ලීටර් 05ක් ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 7,000.00 |
| | | | **10,404,502.64** |
| සැප්:05 | 15 | සේවක ණය<br>එම්.එල්.ඒ.කුමාර<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 240,000.00 |
| සැප්:07 | 16 | සේවක ණය<br>ඩී.ආර්.එම්.එම්.සුබියන්හලී<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 120,000.00 |
| සැප්:13 | 17 | සේවක ණය<br>එස්.එන්.ඩී.එම්.කුමාරි<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 125,000.00 |
| | | **එකතුව** | **10,889,502.64** |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කළ එම්.එන්.ආර්.ජයසූරිය සේවයට වාර්තා නොකරන බැවින් පුරප්පාඩු වූ තනතුර සඳහා ඩී.1/ 4 /1 , තැඹිලියාන, දෙහිඕවිට ලිපිනයේ පදිංචි එම්.පී.ධනුෂ්ක ප්‍රියංකර විජේතිලක යන අය බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් පවතින වියදම් සීමා කර ගැනීම සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රය සහිත බහුකාර්ය ගොඩනැගිල්ල 2023 වර්ෂයට ටෙන්ඩර් නොකිරීමටත් ඒ වෙනුවට දෛනික වැටුප් මත සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු බඳවාගෙන අදාල පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සභාව මඟින් සපයා දී එකී කාර්යය සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

දැනට පිරිසිදු කිරිම් සිදු කරන පිරිස වෙනුවට නව සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙක් බඳවාගෙන එම කාර්ය සිදු කරන ලෙස යෝජනා කරන බවත් දැනට එම කාර්ය සිදු කරන පිරිස ඉවත් කිරීමට හේතුවක් නොමැති බවත් ඔවුන් එම කාර්ය හොඳින් සිදු කරන බැවින් නව බඳවා ගැනීමක් සිදු කිරීමට කටයුතු කරන්නේ ඇයිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 අය වැය කෙටුම්පත මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී කාරක සභාවෙන් මෙම යෝජනාව ඉදිරිපත් වූ බවත් මෙයට හේතු වූයේ අද වන විට ටෙන්ඩරයට අනුව එම පිරිසිදු කිරීමේ කාර්යන් සිදු කරන පිරිස සඳහා රු. 83,000.00 ක මුදලක් මාසිකව වියදම් කරන බවත් මේ කාර්ය සඳහා සේවකයන් දෙදෙනෙක් යොදාගෙන සිදු කරන විට එතරම් මුදලක් වැය නොවන බවත් පෙන්වා දෙන ලදී. එහිදී දැනට සේවයේ යෙදී සිටින සේවකයන් දෙදෙනෙකුම ඒ සඳහා යොදා ගත හැකි බවත් දෛනික වැටුප් ඔවුන් සඳහා ගෙවීමට ක්‍රියා කළත් එතරම් මුදලක් වැය නොවන බවත් පෙන්වා දෙන ලදී. එලෙස සිදු කළ හොත් මී ළඟ ටෙන්ඩරය මීට වඩා වැඩි මුදලකට ගැනීමට ඉඩ ඇති බවත් පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (v) ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු මස් කඩ, මාළු කඩ, සතිපොළ ,පොදු වැසිකිළි , ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම හා එළදාව බදු දීම සඳහා පහත සඳහන් පරිදි ඒ එක් එක් දේපල වලට අදාළව දක්වා ඇති මුදල අවම ලංසු මුදල ලෙස සළකා 2023 වර්ෂය සඳහා බදු දීමට ලංසු කැඳවීම සුදුසු බව යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 01.තල්දූව සතිපොළ ගාස්තු එකතු කිරීම | - | රු: 1,704,600.00 |
| 02.නාපාවල ගව මස් කඩය | - | රු: 1,011,950.00 |
| 03.දෙහිඕවිට ගව මස් කඩය | - | රු: 3,869,760.00 |
| 04.තල්දූව සතිපොළ ගව මස් කඩය | - | රු: 1,271,500.00 |
| 05.ගුරුගල්ල ඌරු මස් කඩය | - | රු: 560,100.00 |
| 06.තල්දූව සතිපොළ එළු කුකුල් මස් කඩය | - | රු: 337,000.00 |
| 07.දෙහිඕවිට එළු කුකුල් මස් කඩය | - | රු: 104,130.36 |
| 08.දෙහිඕවිට අංක 01 මාළු කඩය | - | රු: 147,000.00 |
| 09.දෙහිඕවිට අංක 02 මාළු කඩය | - | රු: 126,500.00 |
| 10.තල්දූව සතිපොළ මාළු කඩය | - | රු: 170,000.00 |
| 11.දෙහිඕවිට පොදු වැසිකිළිය | - | රු: 92,000.00 |
| 12.තල්දූව සතිපොළ පොදු වැසිකිළිය | - | රු: 11,973.83 |

**<u>එළදාව බදු දීම.</u>**

| | | |
|---|---|---|
| 01.මාගම්මන පොදු සුසාන භූමිය | - | රු: 5500.00 |
| 02.මාගම්මන ආයුර්වේද භූමිය | - | රු: 2500.00 |
| 03.තල්දූව කනත්ත භූමිය | - | රු: 3800.00 |
| 04.අබ්බාසිවත්ත රබර් වගා කර ඇති ඉඩම | - | රු: 6000.00 |
| 05.හැරිංඩ් ස්ටේට් භූමිය(වගා කටයුතු සඳහා) | - | රු: 7000.00 |
| 06.අබ්බාසිවත්ත පොදු ළිඳ සහිත ඉඩම | - | රු: 1000.00 |
| 07.පනාවල අල්හම්බ්‍රාවත්ත සුසාන භූමිය | - | රු: 8000.00 |
| 08.මාදොළ ග්‍රාම නිලධාරී වසමේ පිඹුරුපත් අංක 3780 කට්ටි සැළැස්මේ අංක 04 කොටසට අයත් හැරිංඩ් ස්ටේට් නැමැති පර්චස් 7.7 ප්‍රමාණයේ ඉඩම | - | රු: 3,780.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම යෝජනාවට පහත සඳහන් භූමිය බදු දීමට අදාල යෝජනාවද ඇතුලත් කර යෝජනාව සංශෝධනය කරන බව පවසා සිටින ලදී.

09. මාදොල ගංගානි උද්‍යානයේ ක්‍රීඩා පිටියට යාබද කැලෑබද කොටස (පර්චස් 80ක් පමණ) රු.5000.00

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

එළදාව බදු දීම යටතේ මාගම්මන පොදු සුසාන භූමිය පිහිටි ඉඩම බදු දීමට යෝජනා වී ඇති බවත් තමන් දැනුවත්ව මේ ප්‍රදේශයේ පුද්ගලයෙක් හතර වතාවක් මේ භූමියේ එළදාව බදු ගැනීම සඳහා ලිපි ලබා දී තිබෙන බවත් නමුත් ටෙන්ඩරය හිමි වූයේ කා හටද යන්න සම්බන්ධයෙන් දැනුම් දීමක් සිදු කර නොමැති බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ලංසුපත් කැඳවීම වර්ෂය අසන් වීමට පෙර සිදු කරන බවත් එම ටෙන්ඩරයට අදාල පුද්ගලයා ඉල්ලුම් කර තිබුණා නම් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන බවත් එසේ දඅනුම් දීමක් සිදු නොවුනේ නම් වෙනත් අයෙකු ඊට වඩා වැඩි මුදලකට ටෙන්ඩරය ඉල්ලා තිබෙන්නට ඇති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

යොමු කරන ලද ලිපියට සිදු වූයේ කුමක්ද යන්න සම්බන්ධයෙන් නොදන්නා බවත් එසේ සිදු වූවා නම් ඒ බව දැනුම් දිය යුතු බවත් එලෙස සිදු නොවුන බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අදාල ලිපි ගො‍ානුව රැගෙන පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

මාදොල හැරිෆඩ් එස්ටේට් නැමති භූමිය පිහිටා ඇත්තේ කොහේදැයි විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

එළදාව බදු දීම යටතේ ගුරුගල්ල ඌරු මස් කඩය, තල්දූව සතිපොළ ගව මස් කඩය ආදී ස්ථාන විස්තර කර ඇති ආකාරයෙන් හඳුනා ගැනීම පහසු වන බවත් නමුත් එහි සඳහන් අබ්බාසිවත්ත රබර් වගා කර ඇති ඉඩම, හැරිෆඩ් ස්ටේට් භූමිය(වගා කටයුතු සඳහා) යන ඉඩම් පිහිටා ඇති වසම කුමක්ද යන කරුණු පැහැදිලිව සඳහන් කර නොමැති බවත් එලෙස සඳහන් කරන්නේ නම් සුදුසු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ඉඩම් මාදොල පිහිටා ඇති බවත් ඉදිරියේදී එය නිවැරදි කර පළ කිරීමට කටයුතු කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

මේ ඉඩම් වල භූමි ප්‍රමාණය කොපමණද යන්නත් ඇතුලත් කරන්නේ නම් වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශයාමින්ද මැතිතුමා:**

මේ ඉඩම් කොටස් ඉඩම් කට්ටි කිරීම් වලදී සභාවට හිමි වූ ඉඩම් කොටස් බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

අබ්බාසිවත්ත නමින් ඉඩම් කොටස් දෙකක් තිබෙන බවත් හැරිෆඩ් ස්ටේට් නමින්ද ඒ ආකාරයෙන් ඉඩම් කොටස් දෙකක් දක්වා ඇති බැවින් මේවා පැහැදිලිව විස්තරාත්මකව පවතින්නේ නම් සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශයාමින්ද මැතිතුමා:**

මෙම යෝජනාව අලුතින් එකතු කළ එකක් නොවන බවත් සෑම වර්ෂයකම එලදාව බදු දීම යටතේ මෙම ගැසට් කිරීම් සිදු වන බවත් පෙන්වා දෙන ලදී. මෙම නාම ලේඛනය ඒ ආකාරයෙන්ම මීට පෙර වර්ෂ වලත් ඉදිරිපත් කර ඇති බව පැවසූ එතුමා මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට ක්‍රියා කරන බව පවසා සිටියේය. එම නිසා නියමිත දින ගණන සම්පූර්ණ වීමට ඇති බැවින් ගැසට් කිරීම් සඳහා මහා සභා අනුමැතිය ලබා දෙන ලෙස දන්වා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(vi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශයාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මඟින් 2019.12.05 දින පනවන ලද අන්තරාදායක අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පහත උපලේඛනයේ දක්වා ඇති ව්‍යාපාර, පරීක්ෂණ ගාස්තු අය කළ හැකි ව්‍යාපාර ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව 2023 වර්ෂයේ සිට එකී ව්‍යාපාර සඳහා රු. 4500.00 ක පරීක්ෂණ ගාස්තුවක් පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උප ලේඛනය

<u>පරීක්ෂණ ගාස්තු අයකළ යුතු ව්‍යාපාර</u>

1. ලී මෝල්
2. දැව කුඩු කිරීමේ කර්මාන්ත/දැව ආශ්‍රිත කර්මාන්ත
3. කළුගල් කැඩීමේ කර්මාන්ත
4. කළුගල් ඇඹරීමේ කර්මාන්ත
5. ඇඟළුම් කම්හල්
6. සත්ව ගොවිපල්
7. ලැගුම්හල් හා නවාතැන්පල
8. වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
9. බතික් කර්මාන්ත
10. වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන
11. අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
12. මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
13. වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
14. මසකට කිලෝග්‍රෑම් 1000කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
15. සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
16. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
17. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
18. උළු සහ ගඩොල් පෝරණු

19. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
20. පුපුරන ද්‍රව්‍ය භාවිත කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
21. මෘත ශරිර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා.
22. ස්වර්ණාභරන නිෂ්පාදනය සහ අලුත්වැඩියාව.
23. පැරණි අබිලි භාණ්ඩ, යකඩ මිලට ගෙන විකිණීම හා ගබඩා කිරීම

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(vii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂයට අදාලව දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ව්‍යාපාර සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තු 2022.09.06 වෙනි දින පැවති මහා සභාවේදී තීරණ අංක 01(vii) යටතේ සභා සම්මත වී ඇත. එසේ වුවද එහි සඳහන් වූ අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ගණයට නොවැටෙන පහත සඳහන් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අය කළ යුතු ව්‍යාපාර ලෙස හඳුනාගෙන ඇති බැවින් 2022.09.06 මහා සභාවේ තීරණ අංක 01(vii) යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

( මෙම යෝජනාව සංශෝධනය සඳහා ගරු සභාපතිතුමාට අමතරව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා විසින් අත්සන් කර භාර දී ඇත.)

<u>2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශිය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශිය සභාව විසින් සම්පාදනය කරන ලද සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර 2019.12.05 දිනැති අංක 2152/51 දරන පළාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ ප්‍රකාශයට පත්කර ඇති දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අන්තරාදායක,අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මඟින් විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති, අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, II කොටසේ කුමක් සඳහන්ව තිබුණද ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවටත්, වෙළඳ බලපත්‍ර ගාස්තුව 2023 වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර දෙහිඕවිට ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර නොවන ව්‍යාපාර

| I තීරුව | II තීරුව | | |
|---|---|---|---|
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු.750.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක | රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
| 1. ආහාර සඳහා සතුන් ඝාතනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. ආහාර සැපයුම් කිරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |
| 3. තැඹිලි/කුරුම්බා/බුලත්විට/පළතුරු /එළවළු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 4. තේ කඩය හා/හෝ කෝපි කඩය | 500.00 | 750.00 | 1000.00 |
| 5. මස්(හරක්/කුකුලු/එළු/ඌරු), බිත්තර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. මාලු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. සැලොන් / රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. ලැඟුම්හල්/නවාතැන්පලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9. සිල්ලර වෙළඳසැල | 500.00 | 750.00 | 1000.00 |
| 10. හෝටලයක්/ආපනශාලාවක් හෝ බත් කඩයක් | 500.00 | 750.00 | 1000.00 |
| 11. ග්‍රොසරි ව්‍යාපාරය හා/හෝ සාප්පු බඩු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 12. ගොඩනැඟිලි ද්‍රව්‍ය විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. ලිපි ද්‍රව්‍ය අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 15. පූජා භාණ්ඩ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 16. ජංගම දුරකථන අලෙවිය හා අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂයට අදාලව දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කර්මාන්ත සඳහා අයකරනු ලබන කර්මාන්ත බදු පැනවීමට අදාල ඇතැම් කර්මාන්ත බල පත්‍ර ගාස්තු අය කරනු ලබන කර්මාන්ත ලෙස හඳුනාගෙන ඇති බැවින් එම කර්මාන්ත මෙම ලේඛනයෙන් ඉවත් කර බල පත්‍ර ගාස්තු අය කරනු ලබන ව්‍යාපාර ලේඛනයට ඇතුලත් කළ යුතුව ඇත. එබැවින් 2022.09.06 වෙනි දින පැවති මහා සභාවේදී තීරණ අංක 01 (viii) යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

( මෙම යෝජනාව සංශෝධනය සඳහා ගරු සභාපතිතුමාට අමතරව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා විසින් අත්සන් කර භාර දී ඇත. )

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියට අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මේ පනතේ හෝ ඒ යටතේ බලපත්‍රයක් අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛණයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂයේ සිට පනවා අය කිරීමටත් 2023 වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

| I තීරුව | II තීරුව | | |
|---|---|---|---|
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු.750.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 ඉක්මවන, රු.1500.00 නොඉක්මවන අවස්ථාවක | රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
| 1. කිරි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපාර | 500.00 | 750.00 | 1000.00 |
| 2. සිසිල්බීම කර්මාන්ත ශාලාවක්/ අයිස්ක්‍රීම්/ අයිස්පැකට් නිෂ්පාදනය හෝ යෝගට් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 3. කුළු බඩු නිෂ්පාදනය හා පැකට් කර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 4. රසකැවිලි හා බයිට් වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 5. පැල තවානක් හෝ බිම්මල් නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 6. පළතුරු බීම සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 7. හඳුන්කූරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. දැන්වීම් පුවරු සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 9. වෑල්ඩින් කිරීම/ලියවන පට්ටල් වැඩ | 500.00 | 750.00 | 1000.00 |
| 10. කුෂන් කිරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |
| 11. පැණි හා හකුරු නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 12. බටහිර/ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 13. පහන්තිර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 14. බොරළු කැපීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ix) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියේ (2) (ආ) උප වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතුව ඇති වාණිජ වටිනාකමකින් යුක්ත ඉඩම් සඵලමත්ව භාවිතා කරමින් වාණිජ ව්‍යාපෘති ආරම්භ කිරීමේ ස්වයං ආදායම් උත්පාදන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල සඳහා සකස් කරන ලද ව්‍යාපාර සැලැස්ම / ව්‍යාපෘති වාර්තාව සඳහා මහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

වාණිජ ව්‍යාපෘති යටතේ දෙහිඕවිට ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති යෝජනාවට අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බවත් මේ ව්‍යාපෘති වාර්තාව සියළුම මහජන නියෝජිතයන් වෙත ලබා දිය යුතු නොවන්නේදැයි විමසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එක් පොතක පිටු 36 කට ආසන්න ප්‍රමාණයක් තිබෙන බවත් එවැනි පොත් 34ක් මුද්‍රණය කිරීම පවතින කඩදාසි හිඟය මත අසීරු වන බැවින් පිටපත් 03 ක් පමණක් ලබා ගත් බවත් අවශ්‍ය ඕනෑම මන්ත්‍රීවරයෙකුට එය අධ්‍යනය කළ හැකි බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

නමුත් මේ සඳහා අනුමැතිය ලබා දීමට එය අධ්‍යනය කළ යුතු බවත් දැනට මෙහි ප්‍රගතිය කෙසේද ගිවිසුම් අත්සන් කර තිබෙනවාද මේ සඳහා ප්‍රතිපාදන ලබා ගන්නේ කෙසේද දේශීය ණය අරමුදලෙන්ද නොඑසේ නම් වෙනත් වාණිජ බැංකුවකින්ද, මධ්‍යම රජයෙන්ද යන කරුණු දැන ගත යුතු බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සඳහා බලපත්‍රයක් ලබා ගැනීමක් සිදු නොමැති බවත් බලපත්‍රය ලැබුණු පසු ව්‍යාපෘතිය සිදු කිරීමට ප්‍රතිපාදන ලබා ගන්නා මාර්ග සම්බන්ධයෙන් අවධානය යොමු කරන බවත් ඒ සියළුම කාර්යන් සඳහා මහා සභා අනුමැතිය ඉදිරියේදී ලබා ගැනිම සිදු කරන බවත් පවසා සිටියේය. මහා සභා අනුමැතියෙන් තොරව කිසිදු කාර්යක් තමන් විසින් සිදු නොකරන බවත් ඒ සියල්ල මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාව වෙත ඉදිරිපත් කරන බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

ඉන්දන පිරවුම්හල ව්‍යාපෘතිය විධිමත් කාලෝචිත යෝජනාවක් බවත් මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ලාට ගැටළුවක් වී ඇත්තේ සියළු දෙනාටම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධ්‍යනය කිරීමට අවස්ථාවක් නොලැබීම විය හැකි බැවින් කෙටි වේලාවක් ගෙන මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් සිදු කරන්නේ නම් වඩාත් සුදුසු බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

ඇහැලියගොඩ බස් නැවතුම්පලේ කඩ කාමර කුලී ගෙවමින් පවත්වාගෙන යන පිරිස් ඒ ස්ථාන වල ව්‍යාපාර සඳහා මේ වන විට අනුගතව ඇති බවත් නමුත් මේ ව්‍යාපෘතිය හේතුවෙන් එම කඩ කාමර බස් නැවතුම්පලේ වැසිකිළි පිහිටා ඇති ප්‍රදේශයට රැගෙන යාමට කටයුතු කරන බවට එම ව්‍යාපාරිකයන්ට දැන ගැනීමට ලැබී ඇති බවත් එහි සත්‍ය අසත්‍යතාව පැහැදිලි කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

මේ කාර්ය ක්‍රියාත්මක කළහොත් අපගේ ප්‍රාදේශීය සභාව විශාල වත්කමක් සහිතව ගොඩනැගෙන බවත් නමුත් මෙය ගොඩ නැඟීමේදී දැනට අපට බදු ගෙවනු ලබන කඩ කාමර හා අප විසින් බදු ගෙවනු ලබන කඩ හා බස් නැවතුම්පල එම ස්ථානයෙන් ඉවත් කිරීමට සිදු වන බවත් එසේම එම ඉඩම හරහා නිවාස කීපයකට එය මාර්ගය ලෙස භාවිතා කරන පිරිසක්ද සිටින බවත් මේ ව්‍යාපෘතිය සිදු කරන විට ඔවුන්ට කුමක් සිදු වන්නේ ද යන්න සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවත් පවසා සිටියේය.මේ ගැටළු සඳහා ප්‍රායෝගිකව ස්ථිර විසඳුමක් අප විසින් ලබා දිය යුතු බවත් ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සඳහන් කළ පරිදි ව්‍යාපාරිකයන් දැනටමත් සිය කඩ කාමර ඉවත් කරන්නේද , බස් නැවතුම්පළ මේ ස්ථානයෙන් ඉවත් කරන්නේද යන්න සම්බන්ධයෙන් විමසා මහජන නියෝජිතයන්ගෙන් විමසා

සිටින බවත් පවසා සිටියේය. එසේම වර්තමානය වන විට බැංකු ණය සඳහා අධික පොලියක් අය කරන බවත් එවැනි පසුබිමක මේ කාර්යන් කළමනාකරණය කර ගැනීමට කටයුතු කරන්නේ කෙසේද යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කඩ කාමර කිසිවක් ඉවත් කිරීමක් සිදු නොකරන බවත් බස් නැවතුම්පලේ සිට බස් රථ දෙකක් හෝ තුනක් පමණක් ගමන් ආරම්භ කරන බැවින් ව්‍යාපෘති වාර්තාවේ අන්තර්ගත කර ඇති රූප සටහනේ දැක්වෙන ආකාරයට බස් නැවතුම්පළ සහ කඩ ඒ මධ්‍යස්ථානයේ තිබියදීම ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමට අපේක්ෂා කර ඇති බව පවසා සිටියේය. එසේම කෙළවරට වන්නට වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහාත් පහසුකම් පවතින බව පෙන්වා දෙන ලදී. මේ කටයුතු සියල්ල එකවර සිදු නොවන බවත් සැලසුමක් සකස් කර ඇති අතර බලපත්‍රය ලබා ගෙන ඉන්ධන පිරවුමහල ආරම්භ කර ක්‍රම ක්‍රමයෙන් අනෙකුත් ඉදි කිරීම් සිදු කරන බවත් පවසා සිටියේය. මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍ය නම් කාරක සභාවක් බවට පත් කර සිදු කළ හැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

මහා සභාව කාරක සභාවක් බවට පත්කරන බවට යෝජනා කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කර සිටියේය.

කාරක සභා අවස්ථාවෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල සඳහා සකස් කරන ලද ව්‍යාපාර සැලැස්ම / ව්‍යාපෘති වාර්තාව සඳහා වූ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(x) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද නොහොත් ඒ.ජී.දමිඳු චාමින්ද මැතිතුමාට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතිය ලංකා IOC සමාගම සමඟ එකඟත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නෛතිකමය බලය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර පහෙන් පහට සිදු කළ යුතු තක්සේරුව 2018 වර්ෂයේ සිදු කර 2019.09.19 වන දින තක්සේරු දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇත. එකී තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා 2020 වර්ෂයේදී සභා අනුමැතිය ලබා ගත්තද එවකට උද්ගත වූ තත්වයන් හේතුවෙන් එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම වසර 02 ක කාලයක් සඳහා අත්හිටුවීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එහි සඳහන් කරන ලද වසර 02 ක කාලය 2022 වර්ෂයෙන් අවසන් වේ. මෙම තක්සේරුව ක්‍රියාත්මක නොකළහොත් සභාවට ඇති වන මූල්‍ය අගතිය හා විගණන ගැටළු

හේතුවෙන් නව වරිපනම් තක්සේරුව පැනවීම සිදු කළ යුතුව ඇත. එබැවින් 2022.09.06 වෙනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01(xi) යටතේ සිදු කළ 2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව පරිච්ඡින්න කර ඒ වෙනුවට 2018 වර්ෂයේ සිදු කළ නව වරිපනම් තක්සේරුවට අනුව 2023 වර්ෂය සඳහා වරිපනම් ගාස්තු පනවා ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

( මෙම යෝජනාව සංශෝධනය සඳහා ගරු සභාපතිතුමාට අමතරව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා විසින් අත්සන් කර භාර දී ඇත)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

<u>**2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇති පහත උපලේඛන අංක (i) යටතේ වන ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැඟිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2023 වර්ෂය සඳහා වූ තක්සේරුව / සතොයක්ෂණය 2023 වර්ෂය සඳහා තක්සේරුව / සතොයක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන උප වගන්තිය ප්‍රකාර එකී දේපළ මත උපලේඛන අංක (i) හි සඳහන් වන ආකාරයට ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 2%, 3%, 4%, 6%, 7% වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2023 වර්ෂයෙහි පහත උප ලේඛන අංක (ii) හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද දෙහිඕවිට ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල දෙහිඕවිට ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

<u>උප ලේඛනය i</u>

1964/06/26 දිනැති අංක 14080 දරන ලංකාන්ඩුවේ ගැසට් පත්‍රයේ පලවී ඇති දෙහිඕවිට සුලු නගර සභා බල ප්‍රදේශයේ,

| | |
|---|---|
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 940 - 1000 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1000/3-1000/17 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1002 -1070/1 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1084 -1084/3 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 01 - දංගොල්ල පාර/වම - තක්සේරු අංක 3 -65/3 දක්වා | 7% |

කොට්ඨාශ අංක 01 - දංගොල්ල පාර/දකුණ - තක්සේරු අංක 8 -32 දක්වා 7%
කොට්ඨාශ අංක 01 -දංගොල්ල පාර/දකුණ - තක්සේරු අංක 32/5 -62 දක්වා 6%
කොට්ඨාශ අංක 01 - ගුරුගල්ලපාර/වම - තක්සේරු අංක 1/2-95දක්වා 7%
කොට්ඨාශ අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 97-165/5 දක්වා 6%
කොට්ඨාශ අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 175-255 දක්වා 4%

කොට්ඨාශ අංක 01 - මුස්ලිම් පල්ලිය පාර/වම - තක්සේරු අංක 3-37 දක්වා 7%
කොට්ඨාශ අංක 01 - මුස්ලිම් පල්ලිය පාර/දකුණ- තක්සේරු අංක 6-38/14 දක්වා 7%
කොට්ඨාශ අංක 01 - සීතා විද්‍යාලපාර/වම - තක්සේරු අංක 5-61 දක්වා 7%
කොට්ඨාශ අංක 01 - සීතා විද්‍යාල පාර/දකුණ- තක්සේරු අංක 2-58/A දක්වා 7%

කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 611-845 දක්වා 6%
කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 849 -1019/10 දක්වා 7%
කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 1019/14 -1019/24 B දක්වා 6%
කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක1019/26 -1047A දක්වා 7%
කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක1047/8A-1047/38 දක්වා 6%
කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 1049 -1087/A දක්වා 7%
කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/වම -තක්සේරු අංක 1-25 දක්වා 7%
කොට්ඨාශ අංක 02- සුගතාරාම පාර/වම -තක්සේරු අංක 31-41/3දක්වා 4%

කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/දකුණ -තක්සේරු අංක 8/16-11 දක්වා 7%
කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/දකුණ -තක්සේරු අංක 24 -30 දක්වා 6%
කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/දකුණ -තක්සේරු අංක 32 -40 දක්වා 4%

කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 644 – 842/2 දක්වා 4%
කොට්ඨාශ අංක 03- අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 844/3 - 844/5 6%
කොට්ඨාශ අංක 03- අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 844/8 - 844/10 4%

කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක850 –866/1 දක්වා 6%
කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 872 - 932 දක්වා 7%
කොට්ඨාශ අංක 03 - ගුරුගල්ල පාර/දකුණ -තක්සේරු අංක 4 - 100 බී දක්වා 7%
කොට්ඨාශ අංක 03 - ගුරුගල්ල පාර/දකුණ -තක්සේරු අංක 102 -310 දක්වා 6%

කොට්ඨාශ අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 78 - 338 දක්වා 7%
කොට්ඨාශ අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 342 - 408 ඒ දක්වා 6%
කොට්ඨාශ අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 408බී - 636/1 ඒ දක්වා 4%

කොට්ඨාශ අංක 04 - පිරිවෙන පාර/වම -තක්සේරු අංක 1-103 දක්වා 7%
කොට්ඨාශ අංක 04 - පිරිවෙන පාර/දකුණ -තක්සේරු අංක 2 -114 දක්වා 7%

කොට්ඨාශ අංක 05 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 2-76/6 දක්වා 7%
කොට්ඨාශ අංක 05 - ගිණිගත්හේනපාර/වම -තක්සේරු අංක 1 - 401 දක්වා 7%

කොට්ඨාශ අංක 05 - පිරිවෙනපාර/වම -තක්සේරු අංක 113 -271 දක්වා 7%

කොට්ඨාශ අංක 05 - පිරිවෙනපාර/වම -තක්සේරු අංක 275 -345 දක්වා 6%
කොට්ඨාශ අංක 05 - පිරිවෙනපාර/දකුණ -තක්සේරු අංක 116 -274 දක්වා 7%

කොට්ඨාශ අංක 06 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 3-83/2 ඒ දක්වා 7%
කොට්ඨාශ අංක 06 - දැරණියගල පාර/වම -තක්සේරු අංක 3-173/4 දක්වා 6%
කොට්ඨාශ අංක 06 - දැරණියගල පාර/දකුණ -තක්සේරු අංක 4-80 දක්වා 6%
කොට්ඨාශ අංක 06 - ගිණිගත්හේන පාර/දකුණ -තක්සේරු අංක 2-380 සී දක්වා 7%
කොට්ඨාශ අංක 06 - කනංගම පාර/දකුණ -තක්සේරු අංක 6-28 දක්වා 7%
කොට්ඨාශ අංක 06 - කනංගම පාර/වම - තක්සේරු අංක 1-15/1 දක්වා 7%

කොට්ඨාශ අංක 07 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 85-287/2/ඒ දක්වා 7%
කොට්ඨාශ අංක 07 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 287/2සී -605 දක්වා 6%
කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/වම -තක්සේරු අංක 1-51 දක්වා 7%
කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/වම -තක්සේරු අංක 81-149 දක්වා 7%
කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/දකුණ -තක්සේරු අංක 4-32 දක්වා 7%
කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/දකුණ -තක්සේරු අංක 34-162 දක්වා 6%
කොට්ඨාශ අංක 07 - ඇහැලියගොඩ පාර/වම -තක්සේරු අංක 3/6-181 දක්වා 7%
කොට්ඨාශ අංක 07 - ඇහැලියගොඩ පාර/දකුණ -තක්සේරු අංක 6-186 දක්වා 7%
කොට්ඨාශ අංක 07 - මල් වරුෂාව තිඹිරිපොල පාර/වම -තක්සේරුඅංක 9-21 දක්වා 7%
කොට්ඨාශ අංක 07 - මල් වරුෂාව තිඹිරිපොල පාර/වම -තක්සේරුඅංක 27-41 දක්වා 4%
කොට්ඨාශ අංක 07 - මල් වරුෂාව තිඹිරිපොල පාර/දකුණ -තක්සේරුඅංක 6 – 100/14 1/1 දක්වා 5%
කොට්ඨාශ අංක 07 - ක්‍රීඩාපිටිය පාර දකුණ -තක්සේරුඅංක 8-22/4 දක්වා 6%

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 (1) යටතේ කැගල්ල ප්‍රාදේශිය පළාත් පාලන කොමසාරිස් තුමාගේ අංක සී/4 හා 1988/07/04 දින අනුමත කළ දියුණුප්‍රදේශ,

i. මාදොල - අවිස්සාවේල්ල-රත්නපුර පාරේ 61/1 බෝක්කුවේ සිට 62/3 බෝක්කුව දක්වා දම්වැල් 02 ක් - 7%
ii. (පනාවල) - දෙහිඕවිට-ඇහැලියගොඩ පාරේ 0/5 බෝක්කුවේ සිට 62/3 බෝක්කුව දක්වා දම්වැල් 02 ක් -3%
iii. (නාපාවල) -තල්දූව - ගුරුගල්ල පාරේ 2/3 බෝක්කුවේ සිටදයිගල දෙසට 1/6 බෝක්කුව දක්වාමුස්ලිම් පල්ලිය පාරේ දම්වැල් 02 ක් - 2%
iv.මාගම්මන - අවිස්සාවේල්ල - ගිනිගත්හේන පාරේ 11/3 බෝක්කුවේසිට 14/2 දක්වා දම්වැල් 02 ක් - 4%
v. දෙල්ඔලුව -දෙහිඕවිට - දැරණියගල පාරේ 8 වෙනි කිලෝ මීටර්කනුවේ සිට 9/8 බෝක්කුව දක්වා දම්වැල් 02 ක් - 4%

## <u>උප ලේඛනය (ii)</u>

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2023 මාර්තු 31 හෝ ඊට පෙර | ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2023 ජුනි 30 හෝ ඊට පෙර | අප්‍රෙල් 30 |
| තුන්වන කාර්තුව | 2023 සැප්තැම්බර් 30 හෝ ඊට පෙර | ජුලි 31 |
| හතරවන කාර්තුව | 2023දෙසැම්බර් 31 හෝ ඊට පෙර | ඔක්තෝම්බර් 31 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා:**

2020 සැප්තැම්බර් මාසයේදී මෙම යෝජනාව පළමුවර ඉදිරිපත් කළ අවස්ථාවේදී මෙම ප්‍රතිශත අඩු කිරීමට සභාව එකඟ වූ බවත් නමුත් මෙවර නැවතත් පෙර පරිදි වැඩි කරන ලද ප්‍රතිශතම ඇතුලත් කර යෝජනාව ඉදිරිපත් කර ඇති බවත් පෙන්වා දෙන ලදී. එලෙස ප්‍රතිශත වැඩි කළහොත් ජනතාව විශාල අපහසුතාවයකට පත් වන බැවින් මේ සම්බන්ධයෙන් නැවත සලකා බලා ප්‍රතිශත 6% ඇති ප්‍රතිශත 5 % ලෙසත් 7% ඇති ප්‍රතිශත 6%ලෙසත් සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මහා සභාව එකඟ වන්නේ නම් එලෙස සිදු කිරීමට හැකි බවත් ඒ අනුව "සතොයක්ෂණය 2023 වර්ෂය සඳහා තක්සේරුව / සතොයක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන උප වගන්තිය ප්‍රකාර එකී දේපළ මත උපලේඛන අංක (i) හි සඳහන් වන ආකාරයට ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 2%, 3%, 4%, 5%, 6% වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත් " යනුවෙන් අදාල යෝජනාව සංශෝධනය කරන ලදී.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xiii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පසු ගිය කාලය තුළ සිදු කළ තැපැල් ගාස්තු සංශෝධන හේතුවෙන් කාර්යාලයේ තැපැල් මුද්දර මුද්‍රා යන්ත්‍රය යාවත්කාලීන කිරීම සඳහා පවතින මුදල ප්‍රමාණවත් නොවන තත්වයක් උද්ගතව ඇත. එබැවින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ තැපැල් මුද්දර මුද්‍රා යන්ත්‍රයේ ගිණුමේ ගාස්තුව රු 10,000.00 සිට රු 25,000.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xiv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

GIS තාක්ෂණය භාවිත කර මාර්ග සිතියම් ගත කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමට පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ ප්‍රධානත්වයෙන් වයඹ පළාත් සභාවේ සැලසුම් අධ්‍යක්ෂක ඇතුළු නිලධාරීන් කණ්ඩායමේ සම්පත් දායකත්වයෙන් වැඩමුළුවක් 2022.08.30 වන දින දෙහිඕවිට ප්‍රාදේශිය සභා කාර්යාලයේදී පවත්වන ලදී. එහිදි මාර්ග සිතියම් ගත කිරිමේ දී තාක්ෂණ භාවිත කර පහසු මුදලකින් එය සිදු කර ගැනිමේ ඇති හැකියාව පෙන්වා දෙන ලදී. මාර්ගයක් මිනින්දෝරුවෙකු ලවා 1KM මැන සිතියම් ගත කිරිම සඳහා රු 100000.00 පමණ මුදක් වැය වන අතර මෙම තාක්ෂණ භාවිත මගින් සිතියම් ගත කිරිමට දිනකට රු1200.00 පමණ මුදලක් වැය විමක් සිදුවේ.මේ වන විට මෙම වැඩසටහන සාර්ථකව වයඹ පළාත් සභාව මගින් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව මෙම සභාව සතු මාර්ග වල උද්ගතව ඇති ගැටළු නිරාකරණය කරගෙන බල ප්‍රදේශයේ ඇති ප්‍රාදේශීය සභා මාර්ග GIS තාක්ෂණ භාවිත කර මාර්ග සිතියම් ගත කිරිම ආරම්භ කිරීමටත් ඒ සඳහා අවශ්‍ය වන පහත සඳහන් උපකරණ මිලදී ගැනීම සඳහා වැය වන රු. 600000.00 පමණ මුදල සභා අරමුදලින් දැරීමත් සුදුසු බව යෝජනා කරමි.

01.සභාව සතු පරිගණකයක් I 5 වර්ගයේ පරිගණකයක් ලෙස යාවත් කාලීන කිරිම
( Ram –GB,H.D.D- I.T.B)-
02 ස්මාර්ට් ජංගම දුරකථනයක් (4G)

03.මසකට රු 500.00 පමණ වටිනා Data package එකක්
04.External Hard Disk එකක්
05.Power Bank එකක් .
06.32 GB Pen Driver එකක්
07.ඉන්ටනෙට් Dongle එකක්
08.සභාව සතු මෝටර් බයිසිකල් 2 හා ඒවාට සතියකට 4L බැගින් පෙට්‍රල්.
09.ක්ෂේත්‍ර නිලධාරින් සඳහා ගමන් වියදම් දීමනා (රැකියා ලක්ෂයේ පත්වීම් ලාභින් ඇතුළුව)
10.මැනුම් කටයුතු සඳහා වාහනයක් වෙන්කර දීම.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

GIS තාක්ෂණය මගින් මාර්ග සිතියම්ගත කිරීමේ කාර්ය සඳහා රුපියල් ලක්ෂ 06 ක මුදලක් සභාවෙන් ඉල්ලා සිටින බවත් මේ වන විට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ගැසට් කරන ලද මාර්ග 318ක් තිබෙන බවත් පවසා සිටියේය. මේ ගැටළු අවස්ථා කීපයකදීම පෙන්වා දී ඇති බවත් නමුත් ප්‍රායෝගිකව මෙතෙක් සිදු නොවූ බව පැවසීය. අද වන විට එය සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා සිටියත් අත්‍යාවශ්‍යම කාර්යන් පවා යම් සීමාවන්ට යටත්ව සිදු කළ යුතුව ඇති යුගයක මාර්ගයක් කොන්ක්‍රීට් කර ගරනිම සඳහා රුපියල් ලක්ෂයක මුදලක් හෝ ලබා ගත නොහැකි ආකාරයට අත්‍යාවශ්‍ය වියදම් සීමා කරමින් කටයුතු කරන ලෙස චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී ඇති නිසා මෙවැනි කාර්යක් සිදු කිරීමට ප්‍රතිපාදන ඉල්ලා සිටීම පවතින මුදල් තත්වය මත නුසුදුසු බවට තමන් විශාවාස කරන බව පවසා සිටියේය. අද වන විට සභාවේ ආදායම් මාර්ග බෙහොමයක් අඩපණ වී ඇති බවත් වරිපනම් ගෙවා ගැනීමට පවා මහජනතාවට නොහැකි ලෙම ඔවුන්ද ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇති බවත් එසේම සභාවට ආදායම් හිමි විය යුතු කඩ බොහොමයක කඩ කුලී පවා මේ වන විට ගෙවීම සිදු නොවන බැවින් සභා අරමුදලේ ප්‍රතිපාදන ආරක්ෂා කර ගැනීම සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද වන විට වයඹ පළාත් සභාවෙ සියළුම මාර්ග GIS තාක්ෂණය ඔස්සේ සිතියම්ගත කර ගැසට් කිරීම සිදු කර ඇති බවත් නමුත් මෙම බල ප්‍රදේශයේ මාර්ග කිසිවක් ගැසට් කර නොමැති බව පැවසීය. මිනින්දෝරුවන් යොදවා මාර්ග මැනීම සිදු කිරීමට මීට වඩා විශාල මුදලක් වැය වන බවත් අලුත් තාක්ෂණය මගින් මෙම මාර්ග සිතියම් ගත කිරීමේදී එම මාර්ගයේ ගමන් කරමින් මාර්ගයේ දිග පළල සහ අනෙකුත් තොරතුරු ලබා ගෙන ඒවා සිතියම්ගත කර එම තොරතුරු ආශ්‍රයෙන් මාර්ග පළමු වර ගැසට් කර දෙවනි වරත් ගැසට් කර විරෝධතා තිබේ නම් ඒවා ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී අදාල මාර්ග නීත්‍යානුකූලව ගැසට කිරීම සිදු කරන බව පෙන්වා දෙන ලදී. අද වන විට වරකාපොල බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාද මේ ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇති බවත් වයඹ පළාත් සභාවේ මාර්ගෝපදේශය යටතේ මෙය සිදු කරන බවත් පවසා සිටියේය.හිටපු සභාපතිවරයෙකු වන ආනන්ද කුලරත්න මැතිතුමාගේ කාලයේ විරෝධතා කැඳවීම සඳහා සකස් කළ ගැසට් පත්‍රයක් හැරුනුකොට බල ප්‍රදේශයේ කිසිදු මාර්ගයක් අද වන විටත් ගැසට් කර නොමැති බව පැවසූ එතුමා මේ කාර්ය මගින් මාර්ග නීත්‍යානුකූලව ගැසට් කර ගැනීමට හැකියාව ලැබීම ඉතාමත් හොද අවස්ථාවක් බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක් බවත් පසුගිය කාලයේ කාර්මික හා සේවා කාරක සභාව මගින් ස්ථාන පරීක්ෂා සඳහා යන විට අඩි 12 ට තිබූ මාර්ග අඩි 08ට කොන්ක්‍රීට් කළ පසු දෙපස ඉඩම් හිමියන් විසින් වැටවල් ගසා තිබූ අවස්ථාත් දක්නට තිබූ බව පසිහිපත් කළ එතුමා එම නිසා මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඉතාමත් කාලෝචිත බව පවසා සිටියේය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

අය වැය මගින් වැය ප්‍රතිපාදන ලෙස දක්වා ඇති වියදම් දෙස බැලූ විට මෙය අත්‍යාවශ්‍යයෙන්ම ක්‍රියාත්මක විය යුතු කාර්යක් බව පැවසීය. නීතිඥ ගාස්තු වශයෙන් සභාව විශාල මුදලක් මසකට වැය කරන බැවින් එලෙස බැලූ විට මේ කාර්ය සිදු කර මාර්ග නීත්‍යානුකූලව ගැසට් කිරීම ඉතාමත් වැදගත් බව පැවසීය. මේ වියදම් කරනු ලබන රුපියල් ලක්ෂ 06 ට වඩා මේ කාර්ය සභාවට විශාල ආයෝජනයක් බවත් රට පුරා සිදු කළ යුතු කාර්යක් වන මෙය මේ සභාව තුළ ක්‍රියාත්මක කිරීම සැබවින්ම කාලීන අවශ්‍යතාවයක් බව සඳහා වන හොඳ ආයෝජනයක් බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

මෙය සිදු විය යුතු කාර්යක් ලෙස තමන්ද විශ්වාස කරන බවත් මේ සභා බල ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් 232ක් තුළ තිබෙන මාර්ග පද්ධතිය තුළ පෞද්ගලික ඉඩම් හිමියන් හා වෙනත් පාර්ශව සමඟ ඇති වන ආරවුල් විසඳීමේදී අදාල මාර්ග ගැසට් කර තිබීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ බල ප්‍රදේශයේ මාර්ග නීත්‍යානුකූලව ගැසට් කර නොමැති බැවින් අධිකරණ ක්‍රියාවලියට යාමේදී විශාල වශයෙන් සභාව අපහසුතාවයට පත් වන බව පෙන්වා දෙන ලදී. අද පවතින මිල ගණන් යටතේ මිනින්දෝරුවෙකු යොදවාගෙන මාර්ග මැනීම් කටයුතු සිදු කළහොත් රුපියල් ලක්ෂ 06 ක මුදලට මාර්ග 10ක් ආවරණය කර ගැනීමට නොහැකි වන බව පෙන්වා දුන් එතුමා නවීන තාක්ෂණය යොදාගෙන කාලය හා ශ්‍රමය ඉතිරි කර ගෙන මේ කාර්ය සිදු කිරීම වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. මේ ක්‍රමවේදය මඟින් මැනුම් කැනු ලබන මාර්ග වල තිබෙන වීථි පහන් , බෝක්කු ආදී සිල්ලක්ම සඳහන් වන බැවින් කාර්යාලයේ සිටම ඒවා පරීක්ෂා කර බැලීමේ හැකියාවද පවතින බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

පසු ගිය කාලයේ ජනාකීර්ණ ප්‍රදේශ වල මාර්ග සම්බන්ධ ගැටළු බොහොමයක් උද්ගත වූ බවත් නාපාවල ප්‍රදේශයේ බොහෝ ස්ථාන වල මාර්ග පටු වීම මෙන්ම මාර්ගයට අයත් සීමාවෙන්ම බැමි බැඳ ඊට අමතරව මල් වැටවල් සෑදීමෙන් මාර්ග පටු කර ඇති අවස්ථා පෙන්වා දෙන ලදී. මේ හේතුවෙන් මාර්ග පටු වීම මත වාහන දෙකක් මාරු වීමට නොහැකි වන අවස්ථාද දක්නට ලැබෙන බව පැවසූ එතුමා මේ කාර්ය සිදු කරන අතර හැකියාව ඇත්නම් අදාල මාර්ග වල පළල කොපමණද යන්න මාර්ගය ආරම්භයේ සඳහන් කිරීමට හැකි නම් එයද සුදුසු බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා, ගරු මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය, ගරු මන්ත්‍රීනී අජන්තා සුමනදාස මැතිණිය සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.38)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මේ කාර්ය ඉතාමත් කාලෝචිත කාර්යක් බවත් මේ තාක්ෂණය උපයෝගී කරගෙන මාර්ග සිතියම්ගත කිරීමේ ක්‍රියා වලිය මහජන නියෝජිතයන්ටත් අදාල මෘදුකාංගය උපයෝගී කරගෙන අධ්‍යනය කිරීමේ හැකියාව ලබා දිය හැකි නම්ව ඩාත් සුදුසු බවත් එවිට මාර්ග සංවර්ධන කටයුතු වලදී පසුගිය කාලයේ උද්ගත වූ ගැටළුසහගත තත්වයන් ඉදිරියේදී ඇති නොවනු ඇති බවත් පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

මෙවැනි ක්‍රමවේදයක් නොමැති වීම මත. කොට්ඨාස මට්ටමින් පවා විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදු වූ බවත් සභාවක් ලෙස මේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීම සැබවින්ම වැදගත් බවත් පවසා සිටියේය. ඇතැම් අවස්ථා වල ප්‍රධාන මාර්ග වල බෝක්කු වසා තිබෙන බවත් ඒවා හදුනා ගඅනීම සඳහා මේ ක්‍රමවේදය වැදගත් බවත් පවසා සිටියේය. තමන් මීට ටික දිනකට පෙර මාර්ග සම්බන්ධ ගැටළුවක් නිරාකරණය කිරීම සඳහා ගිය අවස්ථාවක අදාල මාර්ගය ගැසට් කර ඇති මාර්ගයක් බවට තමන් ප්‍රකාශ කළ අවස්ථාවේදී අදාල ගැසට් පත්‍රය ගෙනවිත් පෙන්වන ලෙස ප්‍රකාශ කළ බව සිහිපත් කළ එතුමා

එවැනි අවස්ථාවන් සඳහා මෙම ක්‍රමවේදය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර තිබීම කොතරම් වැදගත්ද යන්න අවබෝධ වන බව පවසා සිටියේය. එසේම ජල සම්පාදන මණ්ඩලය මගින් මාර්ල පළුදු කර ජලය ලබා දීම සිදු කර නැවත ඒවා යථා ත්තවයට පත් නොකිරීමේ තත්වයක් ඇතිව තිබෙන බවත් මේ සම්බන්ධ සිදු වීමක් තම ප්‍රදේශයේ සිදු වූ අවස්ථාවක කීපවරක් තමන් විසින් සභාවට දැනුම් දීම් සිදු කළ බවත් පවසා සිටියේය. අද වන විට පස් යොදා යම් මට්ටමකින් එය වසා දැමීමට ඔවුන් කටයුතු කර ඇති බවත් මේ ආකාරයට තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම්ගත කිරීමෙන් එවැනි ගැටළුසහගත ස්ථාන හඳුනාගෙන කඩිනමින් යථා තත්වයට

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

(ගරු මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.43)

කාලයත් සමඟ ඇති වන නවීන තාක්ෂණික වෙනස්කම් සමඟ සභාවන් ඉිදිරියට යන බවත් තමන් මේ සභාව නියෝජනය කරමින් තේරී පත් වූ මුල් යුගයේ සභා වාර්තා මුද්‍රණ කටයුතු යතුරු ලියනට උපයෝගී කරගෙන සිදු කළ බවත් පසුව පරිගණක භාවිතය සමඟ පරිගණක මගින් ඒවා සැකසීමට කටයුතු කළ බව සිහිපත් කළ එතුමා ඒ ආකාරයට කලින් කලට හඳුන්වා දෙනු ලබන තාක්ෂණික ක්‍රමවේද සමග පළාත් පාලන ආයතන ඉදිරියට යා යුතු බව පෙන්වා දෙන ලදී. කාර්මික කමිටුවේ සභාපතිවරයා ලෙස තමන් දිගු කාලයක් මාර්ග ගැටළු සඳහා විසඳුම් ලබා දීමට මැදිහත් වී ඇති බවත් අඩියක ප්‍රමාණයක් හෝ වෙනස් කර ගැනීමට මහජනතාව දක්වන අකමැත්ත දෙස බැලු විට මාර්ග පද්ධතිය ගැසට් ක තිබීම කොතරම් දුරට වැදගත්ද යන්න පෙන්වා දෙන ලදී. එබැවින් මෙය සෑම අතින්ම කාලෝචිත කාර්යක් බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

මේ සඳහා වැය කරන මුදල රුපියල් ලක්ෂ 06ක් වුවත් එය අනාගතය සඳහා සිදු කරනු ලබන විශාල ආයෝජනයක් බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. කාර්මක කමිටුවේ සභාපතිතුමා සඳහන් කළ ආකාරයට මාර්ග සම්බන්ධයෙන් එම කමිටුව වෙත ලැබෙන පැමිණිලි සංඛ්‍යාව දෙස බැලූ විට ඇතැම් අවස්ථාවල ඒවා දිනක් තුළ විසඳීමට  නොහැකි වන බවත් ස්ථාන පරීක්ෂණ සඳහා කීපවරක් යාමට සිදු වන විට ඒ සඳහා යොදා ගනු ලබන වාහන සඳහා ඉන්ධන ඉන්ධන වියදම දෙස බැලූ විට මෙලෙස මාර්ග පද්ධතිය සම්බන්ධ තොරතුරු නිවැරදිව සභාව සතුව පැවතීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් එතුමා මේ වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක විය යුතු බවට තමන්ද විශ්වාස කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ වැඩසටහන ප්‍රායෝගිකව සිදු කිරීමේදි තමන්ට නියෝජනය කරනු ලබන වසම් වල මාර්ග සිතියම්ගත කිරීම සඳහා මැනුම් සිදු කරනු ලබන  අවස්ථාවලදී ඒ කාර්යට සම්බන්ධ වන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බවත් එක් එක් වසම් සඳහා පැමිණෙන දිනයන් ඊට පෙරාතුව දැනුම් දීමට කටයුතු කරන බවත් පවසා සිටියේය. එවාට මාර්ග සම්බන්ධයෙන් ඇති ගැටළු ඒ අවස්ථාවේදීම විසඳා ගැනීමට කටයුතු කළ හැකි බැවින් මේ කාර්ය සාර්ථක කර ගැනිම සඳහා නිලධාරීන්ට අවශ්‍ය සහය ලබා දෙන ලෙස සියළුම මහජන නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක් බව පැවසීය. එසේම මේ ක්‍රමවේදය මාර්ග වලට පමණක් නොව සභාවේ රථවාහන සඳහාද මේ තාක්ෂනික ක්‍රමවේදය භාවිතා  කළ හැකි නම් වඩාත් සුදුසු බව පැවසීය. මන්දයත් පසුගිය කාලයේදී මේ සභාව සතු වාහන වෙනත් කාර්යන් සඳහා දිස්ත්‍රික්කයෙන්ප පිටද භාවිතා කර ඇති බවට චෝදනා එල්ල වූ බැවින් එවැනි සිදු වීම් ඉදිරියේදී සිදු නොවීමට මේ ක්‍රමවේදය උපයෝගී කර ගත හැකි නම් සුදුසු බව පවසා සිටියේය. එැවැනි චෝදනාවක් ඉදිරියේදී එල්ල වුවහොත් අදාල වාහනය නියමිත දිනයේදී ගමන් කලේ කුමන මාර්ගයේදී , ඒ කුමන කාර්යක් සඳහාද යන්න පෙන්වා දිය

හැකි බව පවසා සිටියේය. එසේම මාර්ග පිළිබඳව කතා කිරීමේදී දෙබෑගම අඩි 08 කොන්ක්‍රීට් මාර්ගයට යාබදවම නිවසේ තාප්පය ඉදි කර ඇති ස්ථානයක් මෑත දිනක එම ප්‍රදේශයෙන් ගමන් කිරීමේදී තමන් දුටු බවත් නියමිත ක්‍රමවේද අනුගමනය කර අදාල තාප්පය ඉදි කර නොමැති බව දුටු පමණින්ම අවබෝධ වන බවත් පවසා සිටියේය. එලෙස බැලීමේදී මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම කඩිනමින් සිදු කිරීම වඩාත් සුදුසු බවට තමන් විශ්විස කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඉදිරියේදී ඒ සඳහාත් කටයුතු කරන බවත් මේ ක්‍රමවේදය මඟින් මාර්ග වල පිහිටි විදුලි කණු බෝක්කු ආදී සියල්ලකගේම තොරතුරු අනාවරණය කර ගත හැකි වන බව පවසා සිටියේය. එසේම වාහන සඳහාත් මේ තාක්ෂණය ඉදිරියේදී උපයෝගී කර ගැනීමට කටයුතු කරන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක් බවත් කඩිනමින් ක්‍රියාත්මක කිරීම  සඳහා කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටියේය. ඇතැම් ස්ථාන වල බෝක්කු වසා තිබෙන බවත් ඒවා නිවැරදිව අවබෝධ කරගෙන සත්‍ය ලෙස අදාල මාර්ගයේ පිහිටි බෝක්කු, පාලම් ආදී සියල්ලගේම තොරතුරු නිවැරදි ලෙ ලබා ගෙන එම දත්තද ඇතුලත් කරමින් මාර්ග සිතියම්ගත කිරීමට ක්‍රියා කළ යුතු බව පවසා සිටියේය. ඇතම් අවස්ථා වල වසා දමන ලද මාර්ග , ළිං ආදිය තිබිය හැකි බවත් අඩි 10 මාර්ගය අඩි 08 දක්වා අඩු වී තිබිය හැකි බැවින් ඒ නිසා පූර්ව අධ්‍යානයක් සිදු කර සාකච්ඡා කර පසුව මැනුම් කටයුතු සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය ආරම්භ කිරීමට පෙර මන්ත්‍රීවරුන්ට දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කිරීමට අපේක්ෂා කරන බවත් මාර්ග සිතියම්ගත කර ගැසට් කිරීමට පෙර විරෝධතා කැඳවීමක් සිදු කරන බවත් පවසා සිිටියේය. එලෙස විරෝධතාවයක් එල්ල වුවහොත් අදාල පාර්ශව කැඳවා ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගගැනීමට කටයුතු කරන බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මිනින්දොරුවෙකු නොමැතිව මේ මැනීම් කටයුතු සිදු කර මාර්ග සිතියම්ගත කිරීම සිදු කළහොත් එලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ගැටළුවක් නොමැතිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ කාර්මික නිලධාරියෙක් මේ සඳහා සම්බන්ධ වන බවත් දිග පළල සමඟ විධියෝගත කිරීමක් මෙමඟින් සිදු වන බවත් පෙන්වා දුන් එතුමා මේ වන විට මේ ක්‍රමවේදය වයඹ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන බවත් එලෙස සිතියම් ගත කරන ලද මාර්ග ගැසට් කිරීමේදී එහි නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් ඇති නොවන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මාර්ගයක් ගැසට් කිරීමට අවශ්‍ය බවට යම් පාර්ශවයක් විසින් ප්‍රකාශ කළ පසු ඒ සම්බන්ධයෙන් ගැසට් කිරීම් සිදු කිරීමට පෙර දැන්වීම් එළ කර විරෝධතා කැඳවීම් ආදී කාර්යන් ප්‍රමාණයක් සිදු කරන බවත් මේ කාර්යයෙදී එවැනි මාර්ගයක් ඒ සඳහා එකතු කරනු ලබන්නේ කොසේද යන්න පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

GIS තාක්ෂණය මඟින්ද මැනීම් සිදු කිරීමේදී විරෝධතා කැඳවීම සඳහා මාසයක පමණ කාලයක් ලබා දෙන බවත් ඒ කාලය තුළ ජනතාවට සිය විරෝධතා ප්‍රකාශ කළ හැකි බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මෙය GPS තාක්ෂණය නොවන බවත් GIS හෙවත් Graphic information system යන තාක්ෂණය බවත් පෙන්වා දෙන ලදි. එමඟින් විද්‍යුත් තාක්ෂණය උපයෝගී කරගෙන සිතියම් ගත කිරීමක් මෙහිදී සිදු වන බවත් GPS තාක්ෂණයට වඩා මේ ක්‍රමවේදය උසස් බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අදාල ව්‍යාපෘති නිලධාරීන් සමඟ ඉදිරියේදී සියළුම මන්ත්‍රීවරුන්ට සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා දීමට ක්‍රියා කරන බව පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ  ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වන වගන්තිය ප්‍රකාරව හා අංක 554/5 සහ 1989 අප්‍රේල් 17 වන දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 11 වන රීතියද ප්‍රකාරව සකස් කරන ලද 2023 ජනවාරි මස 01 වෙනි දිනෙන් පටන් ගෙන එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදායම් ඒකරාශීකරණය සහ වියදම් දැරීම පිණිස වූ " කෙටුම්පත් අය වැය ලේඛනය" සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බව යෝජනා කරමි. (ඇමුණුම 11)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අය වැය කෙටුම්පත මහා සභාවට ඉදිරිපත් කරන බවත් මෙය සකස් කිරීම සඳහා මේ සභාව නියෝජනය කරනු ලබන සියළුම මහජන නියෝජිතයන්ට සහ සිවිල් සමාජය නියෝජනය කරනු ලබන පිරිස් වෙත සිය අදහස් හා යෝජනා ලබා දෙන ලෙස පූර්වයෙන් දන්වා සිටි බවත් ඒ  අනුව යොමු වූ අදහස් හා යෝජනා උපයෝගී කරගෙන අය වැය සකස් කර ඇති බවත් තවදුරටත් මේ සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් මන්ත්‍රීවරුන්ට ඒ සඳහා අවස්ථාව අය වැය කතාවෙන් අනතුරුව හිමි වන බවත් පළමුව සිහිපත් කිරීමට කැමති බව පවසා සිටියේය. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 6 වන සභා සැසියෙහි හා තම ධුරකාලයේ පස්වන අයවැය ලෙස 2023 වර්ෂයේ අයවැය තමන් මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටින් බව පැවසිය. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ  අංක 168 (1) වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා ලෙස තමන්හට පැවරී ඇති බලතල වලට අනුකූලව මෙම අයවැය ලේඛනය පිළියෙල කරන ලද අතර ප්‍රාදේශීය සභා පනත මඟින්, මෙම සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා සහ පවත්නා සම්පත් කාර්යක්ෂමව හා සඵලමත්ව  යොදවමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය,  පොදු උපයෝගීතා සේවා,  පොදු මංමාවත් ඇතුළු පහසුකම් ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුබසාධනය සම්පාදනය හා ප්‍රවර්ධන කිරීම තුළින් සුවදායි පරිසරයක් සහිත  තිරසර සංවර්ධිත  ප්‍රදේශයක් බව  පත් කිරීමේ අරමුණින් මෙම අයවැය සකස් කර ඇති බව පෙන්වා දෙන ලදී. මෙම අරමුණු මැනවින් වටහාගෙන සාමූහිකත්වයෙන් යුතුව එම අරමුණු සඵල කර ගැනිම සඳහා කටයුතු කිරීම අප සැමගේ වගකීමක් බව මේ අවස්ථාවේ සිහිපත් කරන බව බව පවසා සිටියේය. 2023 වර්ෂයේ නගර සංවර්ධනයට හා එදිනෙදා කටයුතු වෙනුවෙන් අවශ්‍ය වන අරමුදල් රුපියල් ලක්ෂ තුන්දහස් පන්සිය අසූවක් (ලක්ෂ 3,580ක්) උපයාගැනීමට බලාපොරොත්තු වන බවත්  එම මුදලින් රුපියල් ලක්ෂ එක්දහස් එකසිය

දාහතරක් (ලක්ෂ 1,114ක්) පුනරාවර්ථන වියදම් වෙනුවෙන්ද, රුපියල් ලක්ෂ දෙදහස් හාරසිය හැට පහක් (ලක්ෂ 2,465ක්) මුලධන වියදම් වෙනුවෙන් ද වියදම් කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටියේය. 2023 වර්ෂයේ සභාවේ ආදායම ලෙස රුපියල් රුපියල් ලක්ෂ එක්දහස් එකසිය හැත්තෑවක් (ලක්ෂ 1,170ක්) උපයා ගැනීමට අපේක්ෂා කරනු ලබන බවත් මෙම ආදායම් ඉපයීමේදී ප්‍රදේශයේ ජනතාවට සිදුවන පීඩාව අවම කරමින් මෙම මුදල උපයා ගැනීමට අපේක්ෂා කරන අතර, සභාව සතු වෙනත් ආදායම් මුලාශ්‍ර වලින් ලබා ගන්නා ආදායම් මගින් ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සංවර්ධන හා යටිතල පහසුකම් වර්ධනය කරමින් ඔවුන්ගේ ජීවිත ආලෝකමත් කිරීමට අප විසින් කටයුතු කරනු ලබන බවත් පවසා සිටියේය. 2023 වර්ෂයේ උපයා ගැනීමට අපේක්ෂා කරනු ලබන ආදායම තුල වැටුප් ප්‍රතිපූර්ණ ලෙස මුදල් කොමිසම මගින් පළාත් සභාව හරහා ලැබේ යැයි අපේක්ෂා කරන රුපියල් ලක්ෂ පන්සිය හැට පහක් (ලක්ෂ 565 ක්) හා සංවර්ධන යෝජනා වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා ආධාර ලෙස ලැබේ යැයි ඇස්තමේන්තු කල රුපියල් ලක්ෂ එක්දහස් තුන්සිය තිහක් (ලක්ෂ 1330 ක්) ද ඇතුලත් වන බවත් 2023 වර්ෂයේදී ඇස්තමේන්තු ගත ආදායම පහත දැක්වෙන මූලාශ්‍රයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන බවත් පවසා සිටින ලදී.

| | | |
|---|---|---|
| 01. වරිපනම් හා බදු | ලක්ෂ හැත්තෑ එකක් | (ලක්ෂ 71 ක්) |
| 02. කුලී ආදායම් | ලක්ෂ එකසිය හතලිස් නමයක් | (ලක්ෂ 149ක්) |
| 03. බලපත්‍ර ගාස්තු | ලක්ෂ දහයක් | (ලක්ෂ 10 ක්) |
| 04. සේවා සඳහා ගාස්තු | ලක්ෂ පනස් අටක් | (ලක්ෂ 58 ක්) |
| 05. වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | ලක්ෂ හැට හතරක් | (ලක්ෂ 64ක්) |
| 06. වෙනත් ආදායම් | ලක්ෂ දෙසිය හතලිස් හතක් | (ලක්ෂ 247ක්) |
| 07. ආදායම් ආධාර | ලක්ෂ පන්සිය හැට අටක් | (ලක්ෂ 568 ක්) |
| 08. මුලධන ආධාර | ලක්ෂ දෙදහස් හාරසිය නමයක් | (ලක්ෂ 2409 ක්) |

ඒ අනුව 2023 වර්ෂයේදී ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා එදිනෙදා කටයුතු වෙනුවෙන් සභාව විසින් උපයා ගනු ලැබූ අරමුදල් එක් එක් වැඩසටහන් වෙනුවෙන් වෙන් කර දී ඇති ආකාරය ගරු සභාපතිතුමා විසින් විස්තරාත්මකව පැහැදිලි කර දෙන ලදී. වැඩසටහන් අංක 01 යටතේ පොදු පරිපාලන හා කාර්යය මණ්ඩල සේවා - සාමාන්‍ය පරිපාලනය, වත්කම් ආරක්ෂා කිරීම, විධිමත් විමර්ශණශීලි මුල්‍ය කටයුතු, ආදායම් තක්සේරුව හා ආදායම් උත්පාදනය, පනත්/අතුරු ව්‍යවස්ථා/වෙනත් නීති රෙගුලාසිවලට අනුකූල වීම හා අභ්‍යන්තර විගණන කටයුතු හා පුහුණු කිරීම් සඳහා රුපියල් ලක්ෂ පන්සිය නමයයි (ලක්ෂ 509 ක්) ක මුදලක්ද වැඩසටහන් අංක 02 යටතේ සෞඛ්‍ය සේවා - සාමාන්‍ය පරිපාලනය, රෝග නිවාරණය, ආයුර්වේද හා සුවකම් සේවා, ආහාර පිළිබද ආරක්ෂාව, කාණු පිරිසිදු කිරීම, මාතෘ හා ළදරු සෞඛ්‍යය , සෞඛ්‍ය අධ්‍යාපනය , ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, කසළ කළමනාකරණය, හා කොම්පෝස්ට් නිපදවීම, පරිසර සංරක්ෂණ කටයුතු සඳහා රුපියල් ලක්ෂ දෙසිය පනස් එකක් (ලක්ෂ 251 ක්) ද වෙන් කර ඇති බව පෙන්වා දෙන ලදී. වැඩසටහන් අංක 03 මගින් භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි - සාමාන්‍ය පරිපාලනය, නගර අලංකරණය, මාර්ග,පාලම් හා කාණු සැලසුම් කිරීම, පුළුල් කිරීම හා නඩත්තුව, ඉඩම් හා ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා නඩත්තුව සඳහා රුපියල් ලක්ෂ එකසිය අනූ නවයක් (ලක්ෂ 199 ක්) වෙන් කර ඇති බවත් වැඩසටහන් අංක 05 මගින් පොදු උපයෝගී සේවා - පොදු වෙළඳසැල්, සතිපොළ ඉදි කිරීම නඩත්තුව හා පවත්වාගෙන යාම, සෞඛ්‍ය ආරක්ෂාව සහ පවිත්‍රතාව, වීථි ආලෝකරණය විධිමත් කිරීම හා නඩත්තුව, ආදාහනාගාර හා සුසාන භූමි පවත්වාගෙන යාම හා නඩත්තු කිරීමේ කටයුතු සඳහා රුපියල් ලක්ෂ හැත්තෑ හයක් (ලක්ෂ 76 ක්) වෙන් කර ඇති බව පෙන්වා දෙන ලදී. එසේම වැඩසටහන් අංක 06 මගින් සුබ සාධක සේවා - පුස්තකාල සේවා, ක්‍රීඩා පහසුකම්, තරුණ කටයුතු හා කාන්තා අභිවෘද්ධි වැඩසටහන්, මහජන සුභ සිද්ධිය හා සුබ විහරණය ඇති කිරීමේ වැඩසටහන්, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය, ආපදා කළමනාකරණය හා තිරසර සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් ලක්ෂ හැත්තෑ හතක් (ලක්ෂ 77ක්) ද, වෙන් කර ඇති බව පෙන්වා දෙන ලදී. 2023 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන ආකාරය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගනිමින් නිරෝගී බව හා යහ

පැවැත්ම වෙනුවෙන් ප්‍රදේශය පුරා පැතිර යන බෝවන හා බෝ නොවන රෝග වැලැක්වීම සඳහා අවශ්‍ය බෙහෙත් හා රසායනික ද්‍රව්‍ය ලබා දෙමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සමඟ එක්ව කටයුතු කරනු ලබනවා. විශේෂයෙන්ම ඩෙංගු හා ජල භීතිකා රෝගය වැළැක්වීම පාලනය කිරීම සඳහා විධිමත් වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කරනු ලබන බවත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා පරිසර පොලිසීය සම්බන්ධ වෙමින් මදුරුවන් බෝවිය හැකි ස්ථාන පරීක්ෂාවට ලක් කරන අතර මේ වැඩසටහන් සඳහා රුපියල් ලක්ෂ හතක (ලක්ෂ 07) මුදලක් වෙන් කර තිබෙනබව පෙන්වා දෙන ලදී.

තවද, තිරසර සංවර්ධන අරමුණු අංක 03 යටතේ නිරෝගී බව හා යහපැවැත්ම ළගා කර ගැනීම උදෙසා ප්‍රදේශයේ මාතෘ හා ළදරු සෞඛ්‍ය ඉහල නැංවීම, බෝනොවන රෝග පාලනය සහ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රදේශයේ මහජනතාව සහ පාසල් ළමුන් දැනුවත් කරමින් සෞඛ්‍ය තත්වය වර්ධනය කිරීම පිණිස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ එක්ව වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා ද මුදල් වෙන් කර තිබෙන බව පැවසූ ගරු සභාපතිතුමා වර්තමානය වන විට බෝහෝ පළාත් පාලන ආයතන වලට කසල විශාල ප්‍රශ්නයක්ව පැවතිය ද මෙම සභාව විසින් දිරන කසල උපයෝගි කරගෙන කොම්පෝස්ට් පොහොර නිපද වීමට කටයුතු කරමින් කසල ගැටළුවට සාර්ථක විසඳුමක් ලබාදීමට කටයුතු කර තිබෙන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.02)

අද වන විට කාබනික පොහොර සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර පොලිතීන් බේල් කිරීම සඳහා වන ව්‍යාපෘතිය මඟින් පරිසරයට බැහැර කරන පොලිතීන් ප්‍රමාණය අවම කර ගනිමින් පරිසරයට වන හානිය අවම කර ගැනීමට හැකි වී ඇති බව පැවසීය. ඒ අනුව 2023 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මීටත් වඩා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා හැකි සෑම පියවරක්ම අනුගමනය කිරීම සිදු කරන බවත් පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 11.05)

ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ අප විසින් අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීමේදී ජනතාව සඳහා ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම, සුභසාධනය, ජීවනෝපාය සංවර්ධනය කිරීමේ වැඩසටහන්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු කල යුතුව තිබෙනවා. එබැවින් 2023 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය හා ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ මන්ත්‍රී කොට්ඨාශ මට්ටමින් සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන අසූවක් (මිලියන 80) ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් මෙමඟින් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම අපගේ අරමුණ වන බවත් පෙන්වා දෙන ලදී. 2021 වර්ෂයේදී සපිරිගමක් වැඩසටහන ඉදිරියට ගෙන යමින් සභාව සතු මාර්ග හා කාණු පද්ධති නඩත්තු කිරීම හා අළුත්වැඩියා කරමින් ගමනාගමනයට සුදුසු පරිදි පවත්වාගෙන යාම සඳහා රුපියල් ලක්ෂ විසි එකක (ලක්ෂ 21 ක) මුදලක් වියදම් කර තිබෙන බව පැවසූ එතුමා අතීතයේ ප්‍රදේශයේ ජනතාවට විදුලිය සැපයීමේ වගකීම පලාත් පාලන ආයතන සතුව පැවතියත්, ලංකා විදුලි බල මණ්ඩලය පිහිටුවීමත් සමඟ එම කාර්යයන් ඉටු කිරීමේ බලය ඔවුන්ට පැවරුණු බවත් නමුත් ප්‍රදේශයේ ජනතාව ගමන් කරන මාර්ග වල විථි ආලෝක කිරීම සඳහා විදුලි බල මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලබන අතර ඒ සඳහා 2023 වර්ෂය සඳහා රුපියල් ලක්ෂ විසි පහක් (ලක්ෂ 25 ක්) මුදලක් වෙන් කරනු ලබන බවත් පෙන්වා දෙන ලදී. නවීන තාක්ෂණික දියුණුවත් සමග දැනුම සහ තොරතුරු ලෝකයේ වටිනාම සම්පත් බවට පත්ව තිබෙන පසුබිමක 2021 වර්ෂය තුළදී දෙහිඕවිට මහජන පුස්තකාලයේ විද්‍යුත් පුස්තකාලය ජනතා අයිතියට පත් කරමින් ප්‍රදේශයේ ජනතාවට දැනුම ගවේෂණය කිරීමටත්, තොරතුරු ලබා ගැනීමටත් අවශ්‍ය වන්නාවූ පහසුකම් සැපයීම සිදු කර තිබෙනවා. ඒ තුළින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමටත් වැඩිහිටි සාක්ෂරතාවය ඉහළ නැංවීමටත් හැකි වී තිබෙන අතර ඉදිරි වර්ෂය සඳහාද මේ කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරනු ලබනවා. ඒ අනුව එම පියවර ඉදිරියට යමින් තල්දුව මහජන පුස්තකාලය තුළත් විද්‍යුත් පුස්තකාලයක් 2023 වර්ෂයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍ර කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රිනී සුධර්මා ලක්මාලි මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.08)

අධ්‍යාපනයට අඩිතාලම වැටෙන්නේ පූර්ව ළමා අවධියේ සිටයි. එබැවින් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධනය කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු කරනු ලබනවා. මේ යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් පනාවල පෙර පාසල නවීකරණය කරමින් වඩාත් ප්‍රිය මනාප ස්ථානයක් පත් කර ගැනීමට කටයුතු කරනු ලැබූ අතර 2022 වර්ෂයේ ගුරු ගෙදර දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඇති කිරීමට ප්‍රතිපාදන වෙන් කළද පැවති තත්වයන් හමුවේ සිදු කිරීමට නොහැකි වූ එම කාර්ය 2023 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටියේය. පළාත් පාලන ආයතන වල මන්ත්‍රී දීමනා 2015 වර්ෂයේ සිට වැඩි කරනු ලැබූ අතර ඒ වෙනුවෙන් 2023 වර්ෂය තුළදී මන්ත්‍රී දීමනා ලෙස රුපියල් ලක්ෂ හැට තුනක (ලක්ෂ 63 ක) මුදලක් වෙන් කර ඇති අතර මහජන නියෝජිතයන්ට ලබා දෙන දුරකථන සහ ඉන්ධන දීමනාව වෙනුවෙන් රුපියල් ලක්ෂ තිස් දෙකක (ලක්ෂ 32 ක) මුදලක් වෙන් කිරීමට කටයුතු කර ඇති බව පෙන්වා දෙන ලදී. ජනතා බදු මුදලින් මෙතරම් විශාල මුදලක් මහජන නියෝජිතයින් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කරන බැවින් ඔවුන් සියළුදෙනා 2023 වර්ෂය තුළ පෙරටත් වඩා මහජනතාවට උපරිම සේවයක් ලබා දීමට කටයුතු කරනු ඇතැයි තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. එසේම කොපමණ මූල්‍ය දුෂ්කරතා පැවතියත් ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සංවර්ධන යෝජනා සඳහා පෙර වර්ෂයේ පරිදිම රුපියල් ලක්ෂ 2 බැගින් රුපියල් ලක්ෂ හැත්තෑවක් (ලක්ෂ 70 ක) ප්‍රාග්ධන වැය විෂයන් යටතේ 2023 වර්ෂය සඳහාත් වෙන් කිරීමට කටයුතු කරන බවත් පවසා සිටියේය. 2022 වර්ෂයේ දී ද කොවිඩ් 19 හේතුවෙන් රට තුළ පැවති අයහපත් සෞඛ්‍ය වාතාවරණය නිසා අපේක්ෂිත ආදායම් වර්ෂය තුළ සභාව වෙත නොලැබුනු අතර සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද අවස්ථාව නොලැබුණ බව පෙන්වා දුන් ගරු සභාපතිතුමා , 2022 වර්ෂයේ අයවැය ලේඛනයෙන් වෙන් කල ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් සිදු කළ හා සිදු කරමින් පවතින කර්මාන්ත සහ වැඩසටහන් පිළිබඳව සිහිපත් කරන ලදී. කොවිඩ් වසංගත තත්වය පාලනය කරමින් බල ප්‍රදේශයේ ජනතාව වෙත සහන සැලසීම අරමුණු කර ගනිමින් ගරු ආණ්ඩුකාරතුමාගෙන් සිදු කරන ලද ඉල්ලීමකට අනුව එතුමා විසින් භාවිතයෙන් ඉවත් කර තිබූ ගිලන් රථයක් අප වෙත ලබා දීමට කටයුතු කළ අතර සභාවේ සේවක මහතුන් යොදා ගනිමින් ගිලන් රථය අළුත් වැඩියා කර ධාවනයට සුදුසු තත්වයට පත් කරන ලද බවත් අද වන විට එය ප්‍රදේශයේ ජනතාවගේ සුබසාධන කටයුතු සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතින බවත් පෙන්වා දෙන ලදී. බල ප්‍රදේශයේ සියළුම වසම් ආවරණය වන පරිදි සිදු කරමින් ආ පුබුදුමු පුරවර ජංගම සේවා වැඩසටහන කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ තාවකාලිකව නැවතී තිබුණද 2023 තුළ නැවත ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති බවත් නගර සංවර්ධන සැලැස්මට අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමට අවස්ථාව ලැබුණු අතර , මාගම්මන අවමංගල්‍ය ශාලාවක් ඉදි කිරීමටත්, ළමා උද්‍යානයක් ඉදිකිරීමටත් සැළසුම් කර ඇතත් මේ වන විට රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් එම සංවර්ධන කටයුතු තාවකාලිකව ක්‍රියාත්මක වීම ප්‍රමාද වී තිබුණත් 2023 වර්ෂය සඳහාත් ඒ වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන එලෙසම පවත්වා ගෙන ඇති බව පෙන්වා දෙන ලදී. තවද ස්වයං රැකියා කරනු ලබන කාන්තාවන් දිරි ගැන්වීමේ අරමුණින් ඊරියගොල්ල ප්‍රදේශයේ ඉදිකල හෙළ බොජුන්හල ජනතා අයිතියට පත් කිරීමට හැකියාව ලැබුණු බව පෙන්වා දෙන ලදී. එමෙන්ම විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස තල්දූව සතිපොල සංවර්ධනය කිරීම මෙම සභාවේ ප්‍රමුඛතම කාර්යයක් ලෙස සලකා සංවර්ධන කටයුතු ආරම්භ කර තිබෙන බවත් පසුගිය කාලය තුල ඇති වූ නියං තත්වයේදී බොහෝ ජනතාවට පානීය ජල ගැටළුවක් පැවති බැවින් එම ගැටළු උග්‍ර ව පවතින ප්‍රදේශ තෝරාගෙන ජල මූලාශ්‍ර මඟින් කුඩා පරිමාණයේ ග්‍රාමීය ජල ව්‍යාපෘති ඇති කිරීමටත් අපේක්ෂා කරනු ලබන බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී,ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.12)

මීට අමතරව 2023 වර්ෂය තුළ කහනාවිට ඇල්ල සංවර්ධනය කිරීම මින් සංචාරක ආකර්ශනයෙන් යුත් පුරවරයක් බවට මේ ප්‍රදේශය පත් කිරීමටත්, දෙහිඕවිට බස්නැවතුම්පළ තුළ ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ ව්‍යාපෘතිය තුළින් නගර සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් ලබා දීම සඳහාත්

අපේක්ෂා කරනු ලබන බව පවසා සිටියේය.එපමණක් නොවන ප්‍රදේශයට අත්‍යාවශ්‍ය වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමේ කාර්ය දෙහිඕවිට ජාතික පාසල අසල පිහිටි පැරණි සහා ගොඩනැගිල්ල පිහිටි භූමියේ සිදු කිරීමත් 2023 වසර තුළ අප සතු ප්‍රධාන ඉලක්ක අතර ප්‍රමුඛ කාර්යක් බවට පත් වී ඇති බව පෙන්වා දෙන ලදී. 2023 වර්ෂයේ අයවැය ලේඛනය මඟින් මුදල් වෙන් කල ක්ෂේත්‍රයන් හා එම මුදල් උපයෝගී කර ගනිමින් ඉටු කිරීමට යෝජිත කාර්යයන් පිළිබඳව විග්‍රහයක් සහ එක් එක් සංරචකයන් සඳහා වෙන් වන ප්‍රතිපාදනයන් සභාව හමුවේ ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා ආර්ථික සංවර්ධනය වඩාත් බල ගැන්වීම සඳහා සමාජ සංස්කෘතික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම ද අපගේ වගකීමක් ව පවතින බව පෙන්වාදෙන ලදී. එම වගකීම මැනවින් වටහාගෙන ප්‍රදේශයේ සංවර්ධන හා පරිපාලන කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීමට  තමන්ට උපරිම සහය දෙන ගරු උප සභාපතිතුමා හා සියළුම මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා වෙත තම ගෞරව පූර්වක ස්තූතිය පුදකිරීමට ද මෙය අවස්ථාවක් කර ගන්නා බව පැවසූ ගරු සභාපතිතුමා ඉදිරි වර්ෂය සඳහාද ඔබගේ නොමසුරු සහයෝගය බලාපොරොත්තු වෙන බව පවසා සිටියේය. 2022 වර්ෂයේ දී අපගේ කටයුතු වලට විශාල ශක්තියක් වෙමින් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සහය සහ නායකත්වය ලබාදීම වෙනුවෙන් වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සේම හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාවද ස්තූති පූර්වකව සිහිපත් කරන බවත් මෙම කාර්යන් සඳහා නිරන්තරයෙන් අපට සහයෝගය ලබා දෙන සබරගමු පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් වන ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමාටද, කෑගල්ල දිස්ත්‍රික් නායක ගරු අමාත්‍ය කනක හේරත් මැතිතුමා ඇතුළු ගරු පාර්ලිමේන්තු මැති ඇමති වරුන්ද, සබරගමුව පළාත් සභාවේ හිටපු මන්ත්‍රී අජිත් ශ්‍යාමින්ද මැතිතුමාට ද, තම අවංක ආදර ස්තූතිය පුද කරන බව පවසා සිටියේය. සංවර්ධන හා පරිපාලන කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට තමන්ට උපරිම සහය හා දායකත්වය ලබාදෙන නව ලේකම්තුමියටත් , මෙම අයවැය සකස් කිරීමේ කාර්ය ඉටුකල ගිණුම් නිලධාරිනී නිරාශා පත්මසිරි මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරී මහත්ම මහත්මීන් ද ස්තූති පූර්වකව සිහිපත් කරන බව පවසා සිටියේය. තවද, ප්‍රදේශයේ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා යෝජනා ඉදිරිපත් කරමින් නිරන්තරයෙන් අපට සහයෝගය ලබාදෙන කෑගල්ල දිස්ත්‍රික් ලේකම්තුමා ද, දෙහිඕවිට ප්‍රදේශීය ලේකම්තුමාද, පළාත් පාලන කොමසාරිස්තුමාද, සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නිලධාරීන් ද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ද, ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන් ද, ප්‍රදේශයේ සිවිල් සංවිධාන නියෝජිතයින් ද, ඇතුළු මෙම බල ප්‍රදේශයේ සේවය කරන සියළුම රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන් ද, දෙහිඕවිට ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව ද ගෞරවයෙන් සිහිපත් කරන බව පවසා සිටියේය. අවසාන වශයෙන් ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා සපුරාලමින්, තිරසර සංවර්ධන අරමුණු ජය ගනිමින්, අප විසින් සැලසුම් කර ඇති සංවර්ධන යෝජනාවන් සාර්ථකව ක්‍රියාත්මක කරමින් බල ප්‍රදේශයේ සංවර්ධනය කිරීමට මෙම සභාව නියෝජනය කරන සියළු දෙනාටම ශක්තිය ධෛර්ය ලැබේවායි තමන් ප්‍රාර්ථනා කරන අතර එළඹෙන්නාවූ 2023 වර්ෂයේ ඔබ සැමට සහ සියළු ලාංකික පුරවැසියන්ට නිදුක් නිරෝගී වාසනාවන්ත නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.14)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

මෙම සභාවට වසර 04ක් ගෙවී 05 වෙනි අය වැය කෙටුම්පත මේ සභාවට ඉදිරිපත් කරන ගරු සභාපතිතුමාට සුබ පතන බවත් පැවසුවාය. තමන් කාන්තා මන්ත්‍රීවරියක් නිසා අද දිනයේ අය වැය කතාව තුළින් කාන්තාවන් පිළිබඳව කතා කිරීමට අපේක්ෂා කරන බවත් පසුගිය වසර 04 දෙස ආපසු බැලීමේදී එකම එක වසරක පමණක් කාන්තාවන් හා මව්වරුන් වෙනුවෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව පවසා සිටියාය. 2023 වර්ෂය සඳහාත් කාන්තා අභිවෘද්ධිය වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් වෙන් කර ඇති බවත් වසම් 39 ක් ඇති මේ බල ප්‍රදේශය පුරා විහිදී සිටින කාන්තාවන් වෙනුවෙන් මේ රුපියල් ලක්ෂයෙන් සිදු කළ හැක්කේ කුමන කාර්යක්ද යන්න විමසා සිටියේය.  අපව මේ සභාව වෙනුවෙන් පත් කර එවන ලද කාන්තාවන් වෙනුවෙන් කිසිදු යෝජනාවක් ලබා දීමට අපට අවස්ථාව නොලැබීම සම්බන්ධයෙන් කණගාටු වන බවත් මේ සභාව තුළ ළමා හා  කාන්තා ආරක්ෂණ කමිටුවක් ක්‍රියාත්මක වන බැවින් ඒ හරහා මේ යෝජනා ලබා ගත යුතුව තිබූ බවද පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

යෝජනා ලබා දීම සඳහා අවස්ථාව ලබා දුන්නත් ඒ අවස්ථාවේදී ගරු මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය විසින් කිසිදු යෝජනාවක් 2023 අය වැය කෙටුම්පත සඳහා ලබා දී නොමැති බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

මේ සභාවේ කාන්තා මන්ත්‍රීවරියන් 09 දෙනෙකු සිටින බවත් නමුත් බොහෝ අවස්ථා වල තමන් හැර කිසිදු මන්ත්‍රීවරියක් සභාවේදී කතා නොකරන බව පැවසුවාය. එලෙස සිටීමට නම් නැවත වරක් මේ සභාව සඳහා තේරී පත් වී ඒමට අවශ්‍ය නොවන බව පැවසූ එතුමිය අද ජාත්‍යන්තර ගැහැණු ළමුන්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති බවත් මේ වන විට රට තුළ සනීපාරක්ෂක භාණ්ඩ වල මිල ශීඝ්‍රව ඉහළ යන බවත් බොහෝ කාන්තාවන් දරිද්‍රතාවයෙන් සිටින බැවින් මේ හේතුවෙන් ඉතාමත් අසරණ තත්වයකට පත්ව ඇති බවත් පෙන්වා දෙන ලදී. එවැනි පසුබිමක් තුළ කාන්තා සුබසාධනය වෙනුවෙන් රුපියල් ලක්ෂයක් වෙන් කිරීම ප්‍රමාණවත්ද යන්න විමසා සිටියාය. කාන්තා හා ළමා ආරක්ෂණ කමිටුවක් සභාව තුළ පිහිටුවා ඇති බවත් මෙහි සභාපතිත්වය දරන්නේ ගරු සභාපතිතුමා බව පැවසූ ඇය තමන් වෙනත් ආයතන සංවිධිනය කර පැවැත්වෙන වැඩසටහන් සඳහා ගිය විට කාන්තා ආරක්ෂණ කමිටුවේ සභාපතිත්වය කාන්තා මන්ත්‍රීවරියකට ලබා නොදෙන්නේ ඇයිද යන්න ඔවුන් විසින් විමසා සිටින බව පවසා සිටියාය. 2023 අය වැය සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රතිරූපයක් තමන් තුළ නොමැති බවත් තමන් මේ සඳහා විරුද්ධ වන බව පවසා සිටියාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා:**

2023 අය වැය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට සුබ පතන බව පැවසීය. අද දින සභාවට ඉදිරිපත් කරන ලද GIS තාක්ෂණය මඟින් මාර්ග සිතියම්ගත කිරීමේ කාර්ය ඉතාමත් කාලෝචිත කාර්යක් බවත් ඒ සම්බන්ධයෙන් කතා කිරීමේදී වෙලන්ගල්ල නියෝජනය කරනු ලබන මන්ත්‍රීතුමිය ඇයගේ නිවසට යන වෙලන්ගල්ල මාබුල්ලාවල මාර්ගය අල්ලාගෙන සිටින බවත් එසේම සභාව සතු පොදු ළිඳක්ද ඇය විසින් අත්පත් කරගෙන සිටින බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

එම ළිඳ සභාව සතු ළිඳක් බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන්නේ වගකීමෙන්ද යන්න විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා:**

තමන් වගකීමෙන් ඒ බව ප්‍රකාශ කරන බවත් ගමේ මාර්ගය අඩි 08 ට කොන්ක්‍රීට් කර තිබියදී දෙපසින් තැබිය යුතු අඩි 04 ක ඉඩ ප්‍රමාණය ඉතිරි නොවන ලෙස තාප්පයක් බැද තිබීම නිසා එම මාර්ගය පළල් කර සකස් කර ගැනීමට නොහැකි වී ඇති බව පෙන්වා දෙන ලදී. එම මාර්ගයේ පහළට වන්නට සිටින පුද්ගලයන් මාර්ගය ඉහලින් ඇති මන්ත්‍රීතුමියගේ නිවස අසලින් සිදු වන වරද නිවැරදි කරන්නේ නම් ඔවුන් මාර්ගය පළල් කිරීම සඳහා ඉඩ ලබා දෙන බවට ප්‍රකාශ කරන බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

වෙලන්ගල්ල කනත්ත භූමියත් කිසිවෙකුට හෝ බදු දීමට කටයුතු කරන්නේ නම් එම කනත්ත නිසි ලෙස නඩත්තු කිරීමට අවස්ථාව උදා වනු ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම එම කනත්තේ මෘත දේහ තැබීම සඳහා සක්ස කිරීමට අපේක්ෂා කරන ගොඩනැගිල්ල

සඳහා 2023 වර්ෂයේවත් යම් මූල්‍ය දායකත්වයක් ලබා දී ඒ කාර්ය අවසන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා:**

පොදු ළිං සම්බන්ධයෙන් කතා කිරීමේදී තල්දූව ප්‍රදේශයේ පොදු ළිං 05ක් තිබෙන බවත් ගම් සභා කාලයේදී එම ප්‍රදේශයේ පදිංචිකරුවන් විසින් පොදු කාර්යක් ලෙස සලකා තම ඉඩම් වල කොටසක් මෙලෙස පොදු ළිං සකස් කර ගැනීමට ලබා දී ඇති බව පෙන්වා දෙන ලදී. බොහෝ අවස්ථා වල එලෙස ලබා දී ඇති ඉඩම් කොටස් වල ඉදි කරන ලද ළිං අදාල ඉඩම් හිමියාගේ ඉඩම තුළ පිහිටා ඇති බව පෙන්වා දෙන ලදී. එම නිසා පෞද්ගලික කරුණු ගෙන හැර දක්වමින් මේ සභාවේ කාලය නාස්ති නොකරන ලෙසත් ගමේ පොදු කාර්යක් වෙනුවෙන් සකස් කරන ලද ළිදක් විනාශ වී ගොස් තිබේ නම් දේශපාලන භේදයකින් තොරව එය සකස් කර ගැනීමට කටයුතු කිරීම ගමේ ජනතාවගේවගකීමක් බවත් පෙන්වා දෙන ලදී. එම නිසා මේ සභාවේ සිදු කරන ප්‍රකාශ හේතුවෙන් යම් ගැටුම්කාරී තත්වයක් උද්ගත වව බව හැඟී යන්නේ නම් තම විධායක බලය තුළ එය පාලනය කර ගැනමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය. අද වන විට තල්දූව ප්‍රදේශයේ අඩි 16ට තිබූ පාරවල් අඩි 08 දක්වා පටු වී ඇති බවත් මේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

2023 අය වැය මහා සභාවට ඉදිරිපත් කරන මේ මෙහොතේ ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට ලැබීම සතුටක් බව පවසා සිටියේය. ආයතනයක් පවත්වාගෙන යාම සඳහා අයවැය කෙටුම්පතක් අවශ්‍ය බවත් 2023 අයවැය කෙටුම්පත් විවාදය යනු තමන් සහභාගී වවන 15 වෙනි අයවැය කතාව බව පවසා සිටියේය. අද දිනයේ ගරු සභාපතිතුමාවිසින් සිය අයවැය කතාව ඉදිරිපත් කරන අවස්ථාවේ මේ සභාවේ සිටි ඇතැම් මන්ත්‍රීවරු තේ පානය කළ බවත් ඇතැම් අය නිදි කිරා වැටෙමින් සිටි බවත් ඒ කතාව සම්බන්ධයෙන් අවධානය යොමු නොකළ පිරිස් මේ සභා ගර්භය තුළ සිටි බවත් පවසා සිටියේය. එසේ වන්නට ඇත්තේ අද උදෑසන නිවසින පිටත් වන විටත් තමන්ගේ ඉහළ දේශපාලන අධිකාරිය මේ පළාත් පාලන ආයතනනයේ සභාපතිවරයාට විරුද්ධ බැවින් අපද විරුද්ධ විය යුතුය යන සිතුවිල්ල පෙරදැරිව මේ කාර්ය සඳහා සහභාගී වීම නිසා වන්නට ඇති බව පවසා සිටියේය. එහෙත් අප දරන දේශපාලන මතයෙන් පරිබාහිරව ජනතාවගේ පැත්තේ සිට බැලූ විට ජනතාව මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ හාල් කිලෝව පැවති මිලට ලබා දෙන ලෙසත් පෙට්‍රල් ලීටරය ඩීසල් ලීටරය පැවති මිලට ලබා දෙන ලෙසත් බවත් ඔවුන්ට මේ අවස්ථාව වන විට දේශපාලන මතයක් පිළිබඳ කිසිදු හැඟීමක් නොමැති තත්වයට ඔවුන් පත්ව ඇති බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ;ව: 11.30)

ජනතාව මේ වන විට ඉල්ලා සිටින්නේ දෙපාර්ශවයටම එකතු වී මේ රට ගොඩ ගැනීමට ක්‍රියා කරන ලෙස බව පෙන්වා දෙන ලදී. අද දින සභාවේ මාර්ග සිතියම්ගත කිරීම සම්බන්ධ යෝජනාව සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාත් අද දින ඒ කාර්ය අගය කළ බවත් අලුත් පරම්පරාව නියෝජනය කරන අයෙකු ලෙස තාක්ෂණය සමඟ ඉදිරියට යෑමට ක්‍රියා කිරීමේ අවශ්‍යතාවට තේරුම්ගෙන ඇති බව පවසා සිටියේය. එසේම මේ අයවැය කෙටුම්පත තුළත් අගය කළ යුතු හොඳ කරුණු කාරණා රැසක් තිබෙන බව පෙන්වා දෙන ලදී. තම ධූර කාලය තුළ කිසිදු චෝදනාවකට ලක් නොවූ සභාපතිවරයෙකු ලෙස වර්තමාන සභාපතිතුමා තමන් විසින් හඳුන්වා දෙන බවත් අද වන විට සභා අරමුදලේ රුපියල් දෙකෝටි විසිතුන් ලක්ෂයක තැන්පතුවක් රදවා ගැනීමට එතුමා සමත් වී ඇති බව පෙන්වා දෙන ලදී. අද වන විට වැඩි වන පොලී ප්‍රතිශතයට අනුව ඒ සඳහා සැලකිය යුතු පොලියක් උපයා ගැනීමටද හැකි වන බව පැවසූ එතුමා රුපියල් දෙකෝටි විසිතුන් ලක්ෂය මුදලක් තබාගෙන සභාපති පුටුවේ සිටින නිහතමානී නායකයෙක් වේ නම් ඒ දම්දු ශ්‍යාමින්ද මැතිතුමාම පමණක් බව ප්‍රකාශ කර සිටියේය. මේ සභා වාරය ආරම්භ කරන විට සභා අරමුදලේ පැවතියේ රුපියල් විසිතුන් දහසක මුදලක් පමණක් බව සිහිපත් කළ එතුමා එම මුදල් වියදම් කරමුයැයි පැවසූ විට මහජනතාවගේ මුදල් එලෙස

වියද්ම කරන්නේ ඇයි , යම් හදිසි තත්වයක් උද්ගත වුවහොත් එහිදී මේ මුදල් ප්‍රයෝජනයට ගත හැකි බවට ප්‍රකාශ කළ බව පැවසීය. ඇතැම් දේශපාලන නායකයන් දෙස බැලූ විට ඒ ආකාරයෙන් ගරු සභාපතිතුමා කැදර නොවීම පිළිබඳව, වංචාකාරී නොවීම පිළිබඳව තමන් සතුටු වන බව පවසා සිටියේය. මේ කරුණ අද දින තමන් විසින් ප්‍රකාශ කරන තෙක් ගරු සභාපතිතුමා ලේකම්තුමිය හා කාර්ය මණ්ඩලය හැරුනුකොට මන්ත්‍රීවරු කිසිවෙකු දැන නොසිටි බවත් පැවසීය. ඇතැම්විට මාර්ගයක් කොන්ක්‍රීට් කර ගැනීම සඳහා රුපියල් ලක්ෂයක් හෝ ලබා නොදුන්නේ ඇයිද යන ගැටළුව මන්ත්‍රීවරුන්ට උද්ගත විය හැකි බවත් අද වන විට රුපියල් ලක්ෂයක මුදලකින් එවැනි කාර්යක් අවසන් කළ නොහැකි බවත් පෙන්වා දෙන ලදී. එසේම කොරෝනා වසංගත රෝග කාලයේදී කිසිදු සභාපතිවරයෙකු නොකළ කාර්යන් රැසක් ගරු සභාපතිතුමා විසින් සිදු කළ බව සිහිපත් කළ එතුමා සභාවේ කාර්ය මණ්ඩලයේ සහය ලබා ගෙන ගිලන් රථයක් අලුත්වැඩියා කර ප්‍රදේශයේ සිටි කොරෝනා රෝගීන් රෝහල්ගත කිරීම සඳහා යොදා ගැනීමට කටයුතු කළ බව පවසා සිටියේය. එසේම සභාවේ ප්‍රයෝජනයට නොගෙන අත්හැර දැමූ කැබ් රථ දෙකක් අද වන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගෙන ඇති බවත් එලෙස අලුත්වැඩියා කර හෝ මහජන දේපල විනාශ වීමට නොදී රැක ගැනීමට ගරු සභාපතිතුමා විසින් කටයුතු කරන බවත් පෙන්වා දෙන ලදී. එලෙස රජයේ දේපල ආරක්ෂා කිරීමට ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් අප සතුටු විය යුතු බවත් ගෝත්‍රික සංකල්ප නායකායාට අප ගෝත්‍රික නායකයා යැයි පැවසුවේ වසම් 39ක ජනතාව වෙනුවෙන් සිදු කරන මේ මෙහෙවරේ අගය නොදන්නා නිසා බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

ගෝත්‍රික නායකයා යැයි පැවසුවේ කාටද යන්න විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

නම් වශයෙන් ප්‍රකාශ කිරීමට අකමැති බවත් ලංකාවේ එවැනි දේශපාලන නායකයන් සිටින බවත් පවසා සිටියේය. එම නිසා වසර 77ක් පුරාවට ගෙන ආ එම සංකල්ප ඉදිරියට රැගෙන නොයන ලෙස ඉල්ලා සිටියේය. අවුරුදු 74 කට පෙර තිබූ ඩොලර් ධන ආර්ථිකය අද වන විට ඩොලර් ඍණ ආර්ථිකයක් බවට පත් වී ඇති බවත් ඒ තත්වයට මේ රට පත් වීමට මුල් වූයේ වර්තමාන නායකයන්ගේ ඥාතීන්ම බවත් පෙන්වා දෙන ලදී. ගරු සභාපතිතුමා විසින් සිදු කරන ලද යහපත් යෝජනා මේ අය වැය කෙටුම්පත තුළ දක්නය ලැබෙන බවත් එලෙස ඉදිරිපත් කළ මාගම්මන අවමංගල්‍යා ශාලාව ඉදි කිරීමේ යෝජනාව පැවති තත්වයන් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවත් ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීම සඳහා මේ අය වැය කෙටුම්පත තුළින්ද ප්‍රතිපාදන වෙන් කර ඇති බව පෙන්වා දෙන ලදී. එසේම ඇහැළියගොඩ බස් නැවතුම්පළ භූමියේ ඉදි කිරීමට යෝජිත ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතිය මේ සභාවට හොඳ ආයෝජනයක් බවත් පෙන්වා දෙන ලදී. එසේම ඉදිරියේදී උද්ගත වන ආහාර හිඟයට මුහුණ දීම සඳහාත් යහපත් සිතුවිල්ලකින් යුතුව වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කළ බවත් ඇතැම් අවස්ථාවල වගා කටයුතු සඳහා යොමු වීමට ජනතාවගේ විශාල උනන්දුවක් නොමැතිද යන්න හැඟී යන බව පැවසීය. එසේම පැරණි සහා ගොඩනැගිල්ලේ වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා යම් මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කර ඇති බවත් මේවා සභාව වෙනුවෙන් සිදු කරනු ලබන දිගු කාලීන ආයෝජන බව පෙන්වා දෙන ලදී. මේ පළාත් පාලන ආයතන මේ වන විට විසුරුවා තිබිය යුතු බවත් නමුත් කාලය දීර්ග කිරීම තුළ තවදුරත් රැදී සිටීමට අවස්ථාව හිමි වී ඇති බව පෙන්වා දෙන ලදී. එසේ වුවත් 2015 සහා විසුරුවා දේශපාලන නායකයින්ගෙන් තොරව වසර 03කට වැඩි කාලයක් මේ සභා වල කටයුතු සිදු වූ ආකාරය දෙස බැලූ විට මහජනතාවට සිය ගැටළු විසඳා ගැනීමට නොහැකිව අසරණ වී සිටි බව පැහැදිලිව දක්නට ලැබුණු බව පවසා සිටියේය. එම නිසා මැතිවරණයකට යාමට මෙය අවස්ථාවක් නොවන බවත් නමුත් ජනතාවගේ කුසගින්නට විසඳුම් ලබා දීමේ ප්‍රබල අභියෝගය එයට වඩා වැදගත් කරුණක් බව පෙන්වා දෙන ලදී. ඒ කාරණා දෙස බැලූ විට 2023 අය වැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කරන මේ අවස්ථාවේ එළඹෙන වර්ෂය තුළ විශාල කාර්යභාරයක් සිදු කළ යුතුව ඇති බවත් ඒ කාරණා සපුරා ගැනිම සඳහා ගරු සභාපතිතුමාට අවශ්‍ය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් 2023 අය වැය සඳහා සිය සහය ලබා දෙන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙය තමන් සහභාගී වන 05 වෙනි අය වැය බව පැවසීය. 2018 පළාත් පාලන මැතිවරණයෙන් විවිධ දේශපාලන පක්ෂ යටතේ තරඟ කර මෙම සභාවට තේරී පත් වූ බවත් ජනතාවගේ තීරණය අනුව අද වන විට තමන් ඇතුළු කණ්ඩායම විපක්ෂයේ අසුන්ගෙන සිටින බව පැවසීය. ඒ අනුව මේ සභාව නියෝජනය කරණ ගරු සභාපතිතුමා , උප සභාපතිතුමා සමඟ හෝ වෙනත් කිසිදු මන්ත්‍රීවරයෙකු සමඟ තමන්ගේ පෞද්ගලික අමනාපයක් නොමැති බවත් ඒ හිතවත්කම ඇත්තේ මානියම්ගම පදිංචි රනිල් චන්ද්‍රකුමාර යන පුද්ගලයා පමණක් බවත් නමුත් තමන් මේ සභාව නියෝජනය කරන්නේ 2018 පළාත් පාලන මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් එම ලැයිස්තුවෙන් මේ සභාවට තේරී පත්වූ රනිල් චන්ද්‍ර කුමාර නම් මන්ත්‍රීවරයා ලෙසින් බැවින් මේ ස්ථානයේ තීන්දු තීරණ ගැනීමේදි තමන්ට එය තනිව සිදු කළ නොහැකි බවත් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඡන්දය ලබා දුන් ජනතාව නියෝජනය කිරීම තම වගකීම බවත් පෙන්වා දෙන ලදී. එම නිසා ජනතාවගේ සිතුම් පැතුම් අභිමථාර්ථයන් මුදුන්පත් වන ලෙස තීන්දු තීරණ නොගන්නා අවස්ථා වල ආණ්ඩුවට විරුද්ධව හඬ නැඟීමක් විපක්ෂය තුළින් මහජනතාව බලාපොරොත්තු වන බව පැවසීය. එම නිසා ඒ ක්‍රියාවලියෙන් පරිබාහිරව කටයුතු කිරීමට තමන් පෞද්ගලිකව සූදානම් නොමැති බව පවසා සිටියේය. ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සිය කතාවෙන් ගරු සභාපතිතුමා සිදු කරන යහපත්කාර්යන් සඳහා දායකත්වය ලබා දිය යුතු බවට ප්‍රකාශ කළ බවත් හොද කාර්යන් ලෙස එතුමා අර්ථ දක්වන ලද්දේ මාගම්මක අවමංගල්‍ය ශාලාව ඉදි කිරීමේ ව්‍යාපෘතිය , ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතිය ආදී ව්‍යාපෘති බවත් නමුත් ඒ හොද යැයි කී කාරණා වලට පසු පසින් අයහපත් වූ කාරණාද පෙන්විය හැකි බවත් එතුමා එලෙස කරුණු කීපයක් පමණක් ගෙන හැර දක්වමින් සිදු කලේත් සිය පක්ෂයට ඇති යටහත්කම බව පෙන්වා දෙන ලදී. මැයි 09 වෙනිදා ජනතාව විසින් පහරදෙමින් මේ රජය ප්‍රතික්ෂේප කරන අවස්ථාවේදී හිටපු ජනාධිපතිතුමාට සහ රජයට බැණ වදිමින් දේශපාලනය සිදු නොකරන බවට ප්‍රකාශ කළ පුද්ලගයන් අද වන විට ජනාධිපති රනිල් වික්‍රමසිඟ මැතිතුමා විසින් මේ ගැටළු කෙමෙන් කෙමෙන් නිරාකරණය කරමින් සිටින අවස්ථාවේ එහි බලය ලබා ගෙන නැවතත් මේ සභාව තුළ උද්වේගකාරී ප්‍රකාශ සිදු කරන බව පැවසීය. අද වන විට මේ රජය මේ ආකාරයෙන් පවතින්නේ සහ මේ සභාව තුළ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ට මේ අකාරයට කතා කිරීමට ශක්තියක් ලැබී ඇත්තේ වර්තමාන ජනාධිපතිතුමා නිසා බව පවසා සිටියේය. අද දින ඉදිරිපත් කර ඇති අය වැය කෙටුම්පත පිලිබඳව කතා කිරීමේදී පසුගිය අවස්ථාවලදීත් මේ ලේඛනයේ ඇති අඩුපාඩු පෙන්වා දී ඇති බවත් වැඩසටහන් අංක 01 යටතේ 2021 ආදායම රුපියල් පන්කෝටි හැට නම ලක්ෂ හයදහස් දෙසීයක් ලෙස දක්වා ඇති බවත් 2021 සත්‍ය වියදම ලෙස දෙකෝටි හැත්තෑ හතර ලක්ෂ හැට හතරදහස් හාරසිය හතලිස් නමයක් ලෙස දක්වා ඇති බව පෙන්වා දෙන ලදී. පසුගිය අය වැය අවස්ථාවේදී හිටපු සභාපතිතුමා විසින් ආදායම් වියදම් ඇස්තමේන්තුවකදී සාමාන්‍යයෙන් එය 80% ක් 90%ක් අතර ප්‍රමාණයකට එන්නේ නම් එය ප්‍රශස්ත මට්ටමක් බවට ප්‍රකාශ වූ බවත් එය තමන්ද පිළි ගන්නා බවත් පවසා සිටියේය. එලෙස බැලූ විට ආදායම ප්‍රතිශතයක් ලෙස බැලූ විට 47.09% ක් ලෙස පෙනී යන බව පවසා සිටියේය. එසේම 2022 අය වැය තුළත් මේ තත්වය පවතින බවත් තව මාස කීපයක් ඉතිරිව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ කිරීමට නොහැකි බවත් පවසා සිටින ලදී. 2022 ආදායම ලෙස පන්කෝටි අනූපන් ලක්ෂ අසූ අටදහස් අටසිය හතලිස් පහක් බලාපොරොත්තු වී ඇති බවත් එයින් මේ වන විට ලැබී ඇත්තේ 38.4%ක් පමණක් බවත් පවසා සිටියේය. ඉදිරි මාස කීපය තුළ එය 50%ට වඩා වැඩි අගයක් නොගනු ඇති බව පවසා සිටියේය. තත්වය එසේ තිබියදී 2023 වර්ෂට සඳහාත් ගරු සභාපතිතුමා

විසින් රුපියල් ලක්ෂ 30ක් පමණ වැඩි කර හය කෝටි අසූ අට ලක්ෂයක ආදායමක් අපේක්ෂා කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 11.55)

ඒ අනුව ආදායම් ඇස්තමේන්තුව අසාර්ථක බවත් ඒ ඉලක්ක සඳහා යා නොහැකි බවත් පෙන්වා දෙන ලදී. ආදායම් තත්වය එසේ වුවත් වියදම් පැත්ත මනාවට කළමනාකරණය කර ඇති බවත් ඒ අනුව 2022 හාරකෝටි පනස් තුන් ලක්ෂ හැට දෙදහස් නමසිය අනූ අටක් ඇස්තමේන්තු ගත කර ඇති බවත් නමුත් මේ වන විට එකතු වී ඇත්තේ දෙකෝටි අසූතුන් ලක්ෂයක් බවත් පෙන්වා දෙන ලදී. මේ අනුව බැලූ විට වියදම් ප්‍රතිශතය 80% ඉක්මවා දැක්වෙන බවත් පෙන්වා දෙන ලදී. එසේම පසුගිය වසරට වඩා වියදම රුපියල් ලක්ෂ 50ක දක්වා වැඩි වී ඇති බව පැවසීය. ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා විශාල මුදලක් වෙන් කිරීමට සිදුව ඇති බවත් නමුත් ඒ සඳහා වන වියදම යම් මට්ටමකින් පාලනය කර ගැනීමට අවධානය යොමු කිරීමට තිබුණු බවත් මේ ප්‍රදේශයෙ ්ජනතාව ඊට වඩා දුෂ්කරතා මධ්‍යයේ සිය දෛනික ජීවිතය පවත්වාගෙන යන බවත් පෙන්වා දෙන ලදී. එසේම සෞඛ්‍ය අංශය දෙස බැලූ විට ඒ සඳහා කළ යුතු කාර්යන ්බොහෙමෙයක් ඇති බව පැවසීය. නමුත් එයට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාවත් නොවන බව පවසා සිටියේය. සාමාන්‍යෙයන් සභා වල සම්ප්‍රදායක් ලෙස සභාවේ ආදායම් වලන් තුනෙන් එකක් වත් ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් වෙන් කළ යුතුව ඇති බව පැවසූ එතුමා එලෙස බැලූ විට මේ අය වැය කෙටුම්පත තුළ එවැන්නක් දක්නට නොමැති බව පැවසීය . මහජනතාවගේ මුදල් එකතු කරගෙන නිලධාරීන් හා බලධාරීන් කා බී විනෝද වීමක් පමණක් සිදු වන බවට පිටස්තර ජනතාවට අවබෝධ වනු ඇති බව පවසා සිටියේය. සංශෝධන සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දෙන බවට කතාව ආරම්භයේදී ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළ බව සිහිපත් කළ එතුමා එලෙස සිදු කරන්නේ නම් සතුටු වන බවත් නොඑසේනම් මේ අයවැය අසාර්ථ අයවැයක් බව ප්‍රකාශ කළ යුතු බවත් පවසා සිටියේය. ප්‍රාග්ධන ආදායම් දෙස බැලූ විට 3:88:3:1 යටතේ පළාත් සභාවෙන් ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ රුපියල් ලක්ෂ 20ක මුදලක් ඇතුලත් කර ඇති බවත් ගම සමඟ පිළිසඳරක් සංකල්පය ගෙන ආ පුද්ගලයාට අවසානයේ ලංකාවේ සිටීමටත් නොහැකි තත්වයක් උද්ගත වූ බව සිහිපත් කර සිටියේය. 2021 මේ සඳහා ලක්ෂ 50, 50, 500 ලෙස මුදල් වෙන් කර ඇති බවත් නමුත් එම වර්ෂයේ සිදු කරන ලද කාර්යක් පිළිබඳව දැන ගැනීමට නොමැති බව පවසා සිටියේය. 2022 වර්ෂයේත් ලක්ෂ 120,230,830 ක් ලෙස දක්වා ඇති බවත් ඒවායිනි සිදු වූ කාර්යක් පිළිබඳ සඳහනක් නොමැති බව පෙන්වා දෙන ලදී. ඒ අනුව මේ ආකාරයට මුදල් වෙන් කර අය වැය කෙටුම්පතකට ඇතුලත් කළ හැකිදැයි නීති අංශ ප්‍රධානියෙකුගෙන් තමන් විමසා සිටි බවත් ඒ අවස්ථාවේ සිදු කළ පැහැදිලි කිරීමට අනුව නම් එවැනි ප්‍රශ්නයක් ඇසුව විට ඒ සඳහා පළාත් සභාවෙන් හෝ වෙනත් අමාත්‍යාංශයකින් එවන ලද නීත්‍යානුකූල ලියවිල්ලක් පෙන්වීමට ගරු සභාපතිතුමා විසින් ක්‍රියා කළ යුතු බව පවසා සිටියේය. එසේ නොමැතිව මෙලෙස මුදල් විස්තර ඇතුලත් කළ නොහැකි බව පැවසීය. මේ සම්බන්ධයෙන් ගිණුම් අංශයෙන් විමසා සිටි විට අය වැය කෙටුම්පත සකස් කිරීමට එක් එක් අංශ වලින් තොරතුරු ලබා ගන්නා බවත් ඒ අනුව සංවර්ධණ අංශයෙන් ලබා දුන් තොරතුරු වලට අනුකූලව මේ දත්ත ඇතුලත් කළ බවට ඔවුන් විසින් ප්‍රකාශ කළ බවත් පවසා සිටියේය. සොයා බැලිමේදී පසු ගිය වසර වලත් මේ තොරතුරු අඩංගු වී තිබුණු බැවින ඒවා ඉදිරියට ගෙනවිත් 2023 වර්ෂය සඳහාත් අදාල කරගෙන ඇති බව දැන ගන්නට ලැබුණු බව පවසා සිටි එතුමා ඒ ආකාරයෙන් තොරතුරු ඇතුලත් කිරීම සිදු කළ නොහැකි බව පෙන්වා දෙන ලදී. මේ සියළු ආදායම් දමා ඇත්තේ ප්‍රාග්ධන කොටසට නිසා ඒවා සිදු නොකර සිටිය හැකි බවත් මුදල් ප්‍රතිපාදන නොලැබුණහොත් සිදු කිරීමට හැකියාව නොලැබෙන බවත් පවසා සිටියේය. නමුත් ලේඛනයට ඇතුලත් කර මහජනතාවට විශාල අගයන්ගෙන් මවා පැමක් සූක්ෂම ආකාරයට සිදු කර ඇති බව පවසා සිටි එතුමා මධ්‍යම රජයෙන් වැටුප් ගෙවා ගැනීමට නොහැකි තත්වයකට පත්ව ඇති අවස්ථාවක වියදම් පාලනය කරන ලෙස දන්වන

අවස්ථාවක මේ ආකාරයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට පමණක් සුවිශේෂත්වයක් සිදු නොවන බව පවසා සිටියේය. එම නිසා මෙහි ඇතුලත් කර ඇති අගයන් සියල්ල අසාර්ථක බවත් පෙන්වීමට තව කරුණු තිබුණද අනෙකුත් මන්ත්‍රීවරුන්ටද අදහස් දැක්වීමට අවස්ථාව ලබා දිය යුතු බැවින් තම කතාව අවසන් කරන බව පවසා සිටියේය. අවසාන වශයෙන් පෙන්වා දුන් කරුණු සාධාරණීකරනය කිරීමට හැකි කරුණු පෙන්වා දිය හැකි නම් එය සිදු කරන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිමින් එකඟ විය නොහැකි කාරණයක් සම්බන්ධයෙන් අත් එසවීම සිදු කළ නොහැකි බව පවසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂයේ වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනාවක් අද දින මහා සභාවට ඉදිරිපත් වූ බවත් ඒ අනුව තක්සේරුව ක්‍රියාත්මක කිරීම තුළින් රුපියල් 32ක් වූ ආදායම රුපියල් ලක්ෂ 70 ක් දක්වා වැඩි වන බව පෙන්වා දෙන ලදී. එසේම අතුරු ව්‍යවස්ථාව අනුව බලපත්‍ර ගාස්තු රු.3500.00 ට අමතරව පරීක්ෂණ ගාස්තු ලෙස අමතර රු. 4500.00ක් අය කර ගැනමටත් ක්‍රියා කරන බව පෙන්වා දෙන ලදී. එම ආදායම් සභාවට ලැබී මත සභාවේ ආදායම වැඩි වන බැවින් අදාල ඉලක්ක කරා යොමු වීමට හැකියාව ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

2018 පළාත් පාලන මැතිවරණයෙන් ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස කටයතු කිරීමේ අරමුණින් තමන් මේ සභාවට පත්ව ආ බවත් මේ වසර 04 ක කාලය තුළ තමන් එකතු වී කටයුතු කළ කණ්ඩායම සමඟ අප බලපොරොත්තු වූ ඉලක්ක 100%ක් සාර්ථක කර ගැනීමට නොහැකි වුවත් 40% ක් 50%ක පමණ වන්නට හෝ ඒවා සාර්ථක කර ගැනීමට හැකියාව ලැබුණු බව පවසා සිටියේය. මෙම සභාවේ ධූර කාලය බොහෝ දුරට ලබන වසරේ අවසන් විය හැකි බවත් ඉන් පසුව ජනතාව ඉදිරියට ගොස් අප ඔවුන් සෑහීමකට පත් වන ආකාරයේ සේවයක් සිදු කළාද යන්න ඔවුන්ට තීරණය කිරීම සඳහා මැතිවර‘‘ණයකට යාම උචිත බවට  තමන් විශ්වාස කරන බව පැවසීය. ඒ අනුව අප නැවත සභාවට එනවාද නැද්ද යන්න තීරණය කිරීමේ අයිතිය ඇත්තේ ජනතාව තුළ පමණක් බව පවසා සිටියේය. නමුත් වර්තමානයේ සිදු වන ක්‍රියාවන් හා දැන ගැනීමට ලැබෙන තොරතුරු අනුව මන්ත්‍රීවරු නොමැතිව කොමසාරිස් පාලනයක් සඳහා යොමු වීමේ අපේක්ෂාවක් පවතින බව පැවසූ එතුමා රජයේ ප්‍රධානීන්ගේ තීරණය එය බව පවසා සිටියේය. 2023 වර්ෂයේ අය වැය කෙටුම්පත මඟින් එළඹෙන වර්ෂය සඳහා අපේක්ෂා කරනු ලබන ආදායම කොතෙක්ද වියදම් කිරීමට අපේක්ෂා කරනු ලබන මුදල කොතෙක්ද යන්න දැක්වීමක් සිදු කරන බවත් ඒ කාර්යන් සම්බන්ධයෙන් පුරෝකථනයක් දෙමින් මේ ලේඛනය සභාවට ඉදිරිපත් කරන බව පවසා සිටියේය. සභාව මඟින් සිදු කරනු ලබන මූලික කාර්යන් වන ප්‍රජා සෞඛ්‍ය, කසළ කළමනාකරණය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් මෙය සකසකරන බවත් සංඛ්‍යාත්මකව බලන විට මෙහි ඉලක්කම් ප්‍රායෝගික නොවන බවත් නමුත් සියල්ල කළමනාරණය කරමින් ආර්ථික අවපාතයකට රට මුහුණ දී ඇති මේ අවස්ථාවේ සභාවේ කාර්යන්ද ඒ  අයුරින් පවත්වාගෙන යා යුතු බව පෙන්වා දෙන ලදී. 2021 හා 2022 වර්ෂ තුළ රට තුළ උද්ගත වූ කොරෝනා  වසංගත තත්වය හා අයහපත් දේශපාලනික වාතාවරණ හේතුවෙන් එම අයවැය මඟින් පුරෝකථනය කළ ආදායම් සභාවට උපයා ගැනීමට නොහැකි වූ බවත් එම සිදු වීම් වල බලපෑම පවතින තත්වයක් තුළ විශාල අභියෝගයන්ට මුහුණ දෙමින් ගරු සභාපතිතුමා කාර්ය මණ්ඩලය සමඟ එකතුව මේ අය වැය කෙටුම්පත සකස් කළ බව පැවසීය. එලෙස සකස් කළ අය වැය කෙටුම්පත සඳහා යෝජනා හා අදහස් ලබා දීම සඳහා අවස්ථාව ලබා දුන් බවත් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර මේ පිළිබඳව සාකච්ඡා කළ බවත් පවසා සිටියේය. ඒ අනුව පැරණි සභා ගොඩනැගිල්ල පිහිටි භූමිය තුළ ඉදි කිරීමට යෝජිත වෙළඳ සංකීර්ණය වෙනුවට  පෙර

පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සකස් කිරීමට යෝජනා වූ බවත් එය සංශෝධන යටතේ ඉදිරිපත් කිරීමට නියමිත බවත් පැවසීය. එසේම ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතියත් ඒ ආකාරයෙන් ඉදිරියේ සිදු කිරීමට අපේක්ෂිත සාර්ථක ව්‍යාපෘතියක් බවත් මේ කාර්යන් සඳහා ආරම්භක පියවර ක්‍රියාත්මක කිරීම සිදු කළ පසු බලයට පත් වන වෙනත් පාර්ශවයකට ඒ කටයුතු ඉදිරියට සිදු කරගෙන යා හැකි බවත් පැවසීය. කාන්තාවන් සඳහා වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බවට මන්ත්‍රීතුමියක් ප්‍රකාශ කළ බවත් එතුමිය මේ වන තෙක් කිසිදු යෝජනාවක් අය වැය කෙටුම්පත සඳහා ඉදිරිපත් කර නොමැති බව පෙන්වා දෙන ලදි.2023 වසර තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් අතර පුස්තකාල සංවර්ධනය සඳහා ගැනීමට නියමිත ක්‍රියා මාර්ග වඩාත් අගය කළ යුතු බවත් පවතින වියදම් හේතුවෙන් අධ්‍යාපන කාර්යන් සඳහා අමතර පොත් භාවිතා කිරීමේදී ඒ සඳහා මෙම පුස්තකාල මඟින් ලබා දෙන පහසුකම් බල ප්‍රදේශයේ දූවාදරුවන්ගේ අනාගතය වෙනුවෙන් වඩාත් ඵලදායී කාර්යක් බව පවසා සිටියේය. එම නිසා 2023 අය වැය වෙනුවෙන් ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස තමන් සහයෝගය ලබා දෙන බවත් මේ කාර්යන් ක්‍රියාත්මක කිරීම සඳහා ගරු සභාපතිතුමාට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පැවසීය. එසේම නැවත වරක් මේ සභාව නියෝජනය කිරීම සඳහා තමන් මැතිවරණයකට ඉදිරිපත් වන්නේ නම් ඒ අවස්ථාවේදීත් තමන් ඉදිරිපත් වන්නේ ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස බව සභාවට දන්වා සිටින බව ප්‍රකාශ කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය:**

2023 අය වැය සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රිනී රසිකා එල්ලාවල මැතිණිය කාන්තා සුබසාධනය පිළිබඳව යෝජනා අයවැයට ඉදිරිපත් කර නැති බවට චෝදනා කළ බවත් ගරු සභාපතිතුමාට චෝදනා කරනවාට වඩා රට තුළ මේ වන විට පවතින තත්වය අවබෝධ කර ගන්නේ නම් වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. එතුමිය කාන්තා වැඩමුළුවකට සහභාගී වුවත් කාන්තාවන් වෙනුවෙන් හඬක් නඟන බවත් එය අගය කළ යුතු බවත් පැවසුවාය. එසේ වුවත් තමන් ලබා ගත නොහැකි යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු නොකරන බව පවසා සිටියාය. 2022 වර්ෂය දෙස බැලූ විට පුනරාවර්තන වියදම් යටතේ රු.60,000.00 ක් ව තිබූ ප්‍රතිපාදන මේ 2023 වර්ෂය සඳහා රුපියල් ලක්ෂයක් දක්වා වැඩි කර ඇති බව පැවසුවාය.

(සභාව සෝෂාකාරී)

ලැබෙන ආදායමට අනුව වියදම කළමනාකරණය කර ගැනීමට ක්‍රියා කළ යුතු බැවින් ඒ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර සකස් කරන ලද මේ අය වැය සඳහා තම සහය ලබා දෙන බවත් එම කාර්යන් ක්රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ශන්තිය ගරු සභාපතිතුමාට ලැබේවායි ප්‍රාර්ථනා කරන බවත් පැවසුවාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මෙම කෙටුම්පත් අය වැය තමන් කතා කරනු ලබන 27 වෙනි අය වැය කතාව බව පැවසීය. සමහර විට මේ සභා වාරයේ සිදු කරනු ලබන අවසන් අය වැය කතාව මෙය විය හැකි බව පවසා සිටියේය. ප්‍රාදේශීය සභාවක නිලධාරීන්ගේ එකතුවෙන්එම සභාවේ ලේකම්ගේ මෙහෙය වීම මත සකස් කරන ලද මේ අය වැය කෙමේපතේ අඩංගු කාරණා සහ එහි සත්‍ය අසත්‍යතාව පිළිබඳව විග්‍රහ කිරීම කරුණු දැක්වීම මෙම මන්ත්‍රීවරුන්ට පැවර ඇති වගකීමක් බව පවසා සිටියේය. බැලූ බැල්මට මෙම අය වැය ලේඛනයේ කරුණු දෙස බැලූ විට උපකල්පන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීම හා එවැනි දත්ත ඇතුලත් කිරීම වෙනදාට වඩා වැඩි වී ඇති බව පවසා සිටියේය. ඒ අනුව මේ කෙටුම්පතේ මන්ත්‍රී

මණ්ඩලයේ සංවර්ධන යෝජනා සඳහා 2021 විසිලක්ෂ හැට හත්දහස් පන්සිය හැට හතක මුදලක් වෙන් කර තිබූ බවත් 2022 එය ලක්ෂ හැත්තෑවක් ලෙස වෙන් කර ඇති බවත් පැවසූ එතුමා 2022 අගෝස්තු වන විට මන්ත්‍රී මණ්ඩලයේ සංවර්ධන යෝජනා සඳහා එකොලොස් ලක්ෂ අහඅටදහස් දෙසීය අසූ පහක මුදලක් වියදම් කර ඇති බවට සඳහන් කර ඇති බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම මුදල 2021 වර්ෂයේ සිදු කරන ලද වැඩ සඳහා ගෙවා නොතිබූ මුදල් ගෙවීම් මේ වර්ෂයේ සිදු කළ බවත් එම ගෙවීම් මේ ආකාරයට සඳහන් වී ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

තම අත්දැකීම අනුව මේ සභාවේ සිටි සෑම සභාපතිවරයෙකුම තමන්ට හිතවත් පිරිසක් වෙනුවෙන් වැඩි වැඩියෙන් සංවර්ධන යෝජනා සඳහා අවස්ථාව ලබා දුන් බව පවසා සිටියේය. එම නිසා 2018 මේ ප්‍රාදේශීය සභාව ස්ථාපිත කළ අවස්ථාවේදී යහ පාලන රජයේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ රජය ක්‍රියාත්මක වූ බවත් ඒ කාලයේ බලයට පත් වූ මේ මන්ත්‍රීවරු රනිල් වික්‍රමසිංහ මහ බැංකුව කොල්ල කෑ බවත් එවැනි විනාශයක් සිදු කළ පාලකයෙකු බලයෙන් ඉවත් කර මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ගෙන ඒම සඳහා සහය ලබා දෙන ලෙස ඉල්ලමින් මැතිවරණය ජයග්‍රහනය කළ බව පවසා සිටියේය. එලෙස පත් වූ මහජන නියෝජිතයන්ට දිට්ඨධම්මවේදනීය කර්මය පළිසන් දී අද වන විට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ රජයක් යටතේ කටයුතු කිරීමට සිදු වී ඇති බව පෙන්වා දෙන ලදී. අද දින අදහස් ප්‍රකාශ කළ මන්ත්‍රීවරු ගෝත්‍රික නායකයෙක් ගැන සඳහන් කළ බවත් ඒ කවුරුදැයි තමන් කල්පනා කළ බවත් එසේ නම් තමන් නියෝජනය කරන්නේ එක්සත් ජාතික පක්ෂය බැවින් එහි නායකයා රනාල් වික්‍රමසිංහ මැතිතුමා වන නිසා ඔවුන් පවසන ගෝත්‍රික නායකය එතුමා නම් ඒ නායකයා යටතේ කටයුුතු කිරීමට ඔවුන්ට සිදු වීම දෛවෝපගත සිදුවීමක් බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

එම නිසා මේ අය වැයට අප සහය ලබා දිමට නම් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු ස්වාධීන විය යුතු බවත් එසේ නොමැති නම් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා යටතේ ඇති ආණ්ඩුව සමඟ කටයුතු කරන්නේ නම් එක්සත් ජාතික පක්ෂයට එකතු විය යුතු බවත් එසේ නොමැතිව දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරමින් කටයුතු කරන විට සහ ලබ දියි නොහැකි බවත් පවසා සිටියේය. මේ වන විට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මහජනතාව විශාල පීඩනයකට ලක්ව  ඇති බවත් ඔවුන්ට මුහුණ දීමට නොහැකිව සිටි ප්‍රාදේශීය දේශපාලන නායකයන් දැන් වර්තමාන ජනාධිපතිවරයාගේ පිහිටෙන් සෙමින් සෙමින් නැවත ජනතාව අතරට යාමට කටයුතු කරන බවත් වර්තමානයේ ලාංකික දේශපානයේ සත්‍ය ස්වරූපය එය බවත් පවසා සිටියේය. මේ අය වැය ලේඛනයේ 60%ක්ම සාවද්‍ය කරුණු බවත් සභාවේ පැවැත්ම ආරක්ෂා කර ගැනීමට නම් ඵලදායී යෝජනා ඉදිරිපත් කළ යුතුව ඇති බවත් පවසා සිටියේය. ඵලදායී විවේචන සිදු කිරීම මඟින් විපක්ෂය කටයුතු කරන්නේ මේ සභාවේ පැවැත්ම රදවා ගැනීමට බවත් ඒවාට සාවධානව ඇහුම්කන් දීම ගරු සභාපතිතුමා ප්‍රමුඛ ආණ්ඩු පක්ෂයේ වගකීම බව පවසා සිටියේය.  ඒ අනුව බැලූ විට 2023 අය වැය සඳහා සහය ලබා දීමට විපක්ෂයට හැකියාව නොමැති බවත් වසම් 39 ටම සමාන සේවයකි සිදු වන ලෙස මේ යෝජනා සකස් කළ යුතු බව පෙන්වා දෙන ලදී. වර්තමාන සභාපතිතුමා මූල්‍ය වංචා සිදු නොකරන බව විපක්ෂයත් පිළිගන්නා බවත් නමුත් මීට පෙර පැවති සභා වාර වලදී එවැනි අක්‍රමිකතා සිදු වී ඇති බව සිහිපත් කර සිටියේය. එසේ වුවත් මේ වැඩපිිළිවෙල තුළ සාර්ථක සේවයක් සිදු නොවූ බවට

විපක්ෂය වශයෙන් ප්‍රකාශ කළ යුතු බව පැවසූ එතුමා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ට පවා හෘද සාක්ෂියට එකඟව මෙයට පක්ෂ විය හැකිද යන්න විමසා සිටියේය. නමුත් අතීතයේ එවැනි ඍජු තීරණ ගත් ඇතැම් ආණ්ඩු පක්ෂය නියෝජනය කළ දේශපාලඥයන් සිටි බවත් පවසා සිටියේය. සභා අරමුදලේ දෙකෝටි විසිතුන් ලක්ෂයක් තිබෙන බවට අද දිනයේ ප්‍රකාශ වූ බවත් එසේ නම් බල ප්‍රදේශයේ මන්ත්‍රීවරුන්ට සංවර්ධන කාර්යන් සඳහා එම මුදලින් යම් ප්‍රමාණයක් ලබා දිය හැකි බව පැවසූ එතුමා ඒ සම්බන්ධ යෝජනා ගෙන එන විට සභා අරමුදලේ මුදල් ප්‍රතිපාදන නොමැති බව පවසමින් ඒවා මඟහැරීමට ගරු සභාපතිතුමා කටයුතු කළ බව සිහිපත් කර සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දැන් අවශ්‍ය වන්නේ එම මුදල ආරක්ෂා කර ගැනීමද වියදම් කිරීමද බව පැහැදිලිව ප්‍රකාශ කරන ලෙස ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාට දන්වා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

සම්පූර්ණ මුදල වියදම් නොකර මන්ත්‍රීවරුන්ට සංවර්ධන කටයුතු සඳහා යම් මුදලක් ලබා දීමට හැකියාව තිබූ බව පවසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

එම නිසා මේ අය වැය ලේඛනයේ අන්තර්ගතය බොරුවක් වන බැවින් මේ සඳහා සහය ලබා දිය නොහැකි බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

වසම් මට්ටමින් සේවයක් නොවූ බවට ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා ප්‍රකාශ කළත් අද උදෑසන තමන් දුරකථනයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ෆේස්බුක් ගිණුම පරීක්ෂා කරන විට සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා විසින් බෙදා දුන් බීජ වල ප්‍රථම අස්වැන්න නෙලා ගන්නා බවත් ඒ සඳහා එතුමාට ස්තුතිවන්ත වන බවත් පවසා පළ කරන ලද දැන්වීමක් දුටු බවත් සභා අරමුදලේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන සිදු කරන ලද වැඩසටහන් වෙනුවෙන් ජනතාව ස්තුතිවන්ත වන්නේ සභාපතිවරයා ලෙස තමන්ට පමණක් නොවන බවට මෙය උදාහරණයක් බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මේ සභා කාලයේ පස් වන අය වැය ඉදිරිපත් කරන මේ මොහොත වන විට මේ සභාව නියෝජනය කරන කිසිදු මන්ත්‍රීවරයෙකුට ජන වරමක් නොමැති බවත් මැතිවරණයකට නොයා ජනතා මතය ප්‍රකාශ කිරීමට අවස්ථාව නොදෙන පසුබිමක ඉදිරිපත් කරන අය වැයක් බවට මෙය හඳුන්වා දෙන බවත් පැවසීය.මීට පොර මෙවැනි අය වැය 04ක් සඳහා අප මුහුණ දුන් බවත් ඒවා ඉදිරිපත් කිරීමේදීත් යෝජනා ලබා දෙන ලෙස දැන්වූවත් බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව දරුවන්ගේ අධ්‍යාපනය ආදී කාර්යන් වලට අදාලව අප විසින් යෝජනා අනන්ත අප්‍රමාණ ප්‍රමාණක් මේ සභාවට ලබා දී තිබුණත් අවසානයේ ඉලක්කම් ගපලා සකස් කරන ලද මනොරාජික අයවැයක් මේ සභාවට ඉදිරිපත් කර ඇති බවත් පවසා සිටියේය. එම නිසා මෙවැනි අය වැයක් සඳහා යෝජනා ලබා දුන්නත් එහි ප්‍රයෝජනයක් නොමැති බව අත්දැකීමෙන් දන්නා බව පවසා සිටියේය. අද වන විට අප රටේ දරුවන් තුන්දෙනෙකුගෙක්

එක් අයෙකු මන්දපෝෂණයෙන් පෙලෙන බවත් අය වැය කෙටුම්පතක් මඟින් තොකරම් පුරාජේරු පැවසුවත් අසියාවේ උද්ධමනයෙන් දෙවන ස්ථානයේ සිටින්නේ අප රට බව පෙන්වා දෙන ලදී. අද වන විට වේලක් කෑමට නොහැකිව බොහෝ පිරිසක් දුක් විදිනා බවත් රාජ්‍ය සේවකයන්ට තම වැටුපෙන් බස් වියදම ගෙවා ගත් පසු ජීවත් වීමට එම වැටුප ප්‍රමාණත් නොවන බවත් පෙන්වා දෙන ලදී. එවැනි තත්වයක් තුළ ජීවත් වන අප ඒ වෙනුවෙන් සිදු කලේ කුමක්ද යන්න විමසා සිටියේය. පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට අවශ්‍ය කොපි පොතක් මිලදී ගැනීමට දෙවරක් සිතිය යුතු තැනට පත්ව ඇති බවත් කොටින්ම මේ රට මේ වන විට විශාල ඛේදවාචකයකට මුහුණ දී ඇති බවත් පෙන්වා දෙන ලදී. ඉදි කිරීම් ක්ෂේත්‍රෙය් 95%කට පමණ රැකියා අහිමි වී ඇති බවත් මේ ප්‍රදේශයෙ කම්කරු රැකියා සිදු කළ විශාල පිරිසක් මේ හේතුවෙන් අසරණ වී ඇති බවත් පෙන්වා දෙන ලදී. මේ වසර 04 තුළ මේ සභාවේ සිදු වූයේ සම්ප්‍රදායික කාර්යන් ටිකක් පමණක් බවත් ඒවා කොමසාරිස් පාලන කාලයේත් සිදු වූ කාරණා බවත් පෙන්වා දුන් එතුමා අද වන විට තාක්ෂණයෙන් ලෝකයේ අනික් රටවල් තිබෙන තැනත් ලංකාව ලවතින තළනත් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටියේය. එම නිසා මේ අය වැයට සහය ලබා නොදෙන බවත් මේ සඳහා බෙදීමක් අවශ්‍ය බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් නව යෝජනා ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් අවශ්‍ය සංශෝධන සිදු කිරීමය සූදානම් බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

සභාව තව වසරක කාලයක් දීර්ග කිරීම හේතුවෙන් ඉදිරිපත් කරනු ලබන මේ අය වැය වසම් 39 ක ජනතාවට සේවය කරන අදහසින් ඉදිරිපත් කර ඇති බව පවසා සිටියේය. අද දිනයේ අය වැය කෙටුම්පත සම්බන්ධයෙන් ප්‍රශංසාත්මකව කතා කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයෙන් දෙකෝටි විසි ලක්ෂයකට ආසන්න මුදලක් සභාව සතුව පවතින්නේ නම් එය වෙනස් අයුරින් අර්ථවත් ලෙස ආයෝජනය කළ හැකි බව පවසා සිටියේය. එම නිසා වගා සංග්‍රාම ආදී ව්‍යාපෘති සිදු කිරීම අවශ්‍ය නොවන බවත් ජනතාව කොසේ හෝ තුන්වේල කෑමට යමක් උපයා ගැනීමට කටයුතු කරන බැවින් එම මුදල් උපයෝගී කරගෙන වසම් 39 නියෝජනය කරමින් රට භාර ගැනීමට සිටින අහිංසක දරුවන් සඳහා පොත් කට්ටල් 100 බැගින් ලබා දීමට කටයුතු කරන්නේ නම් සැබවින්ම ප්‍රශංසනීය බව පවසා සිටියේය. ඉන්ධන පිරවුම්හලක් සම්බන්ධයෙන් යෝජනාවක් ගෙන ඇති බවත් මෙතරම් කඩිමුඩියේ එවැනි කාර්යක් සඳහා යොමු වෙනවා වෙනුවට දරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් යසම් සාර්ථක ව්‍යාපෘතියක් සිදු කරන ලෙස ඉල්ලා සිටියේය. සමස්ථයක් ලෙස සලකා බැලීමේදී මේ අයවැයට තමන් විරුද්ධ බවත් තමන් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් ලෙස මෙවැනි අය වැයක් ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කරන විට විපක්ෂය සිදු කරනු ලබන්නේ එයට විරුද්ධ වීම බව අප සැම දන්නා කරුණක් බව පැවසීය. සාමාන්‍යයෙන් අය වැට කෙටුම්පතක ඉදිරිපත් කර ඇති අපේක්ෂිත ආදායම් වලට ඒ ඒ කාල වල පවතින සමාජ තත්වයන් යටතේ ළඟා වීමට නොහැකි වන අවස්ථා උද්ගත වන බවත් පසු ගිය අය වැය තුළත් එලෙස සිදු වී ඇති බවට ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා විසින් පෙන්වා දුන් බව සිහිපත් කර සිටියේය. නමුත් 2021 වර්ෂය තුළ රටේ පැවති තත්වය දෙස බැලූ විට මේ කරුණු අවබෝධ කර ගත හැකි

වනු ඇති බව පවසා සිටියේය. 2018 වර්ෂයේ පිහිට වූ මෙම සභා වාරයෙන් වසර 1 ½ කට වැඩි කාලයක් අප ගත කලේ යහපාලන රජය යටතේ බවත් ඒ කාලයේදී මධ්‍යම රජයෙන් ලැබෙන ප්‍රතිපාදන නොලැබුණු බවත් පළාත් සභා බලයක් නොතිබුණු බවත් පැවසූ එතුමා 2019 ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පැමිණි පසු කෝටි 60 කට ආසන්න මුදල් ප්‍රමාණයක් වියදම් කර සපිරි ගමක් වැඩසටහන යටතේ ව්‍යාපෘති රැසක් සිදු කළ බව පවසා සිටියේය. කොවිඩ් වසංගත තත්වය මත සභාවට හිමි විය යුතු ආදායම් බොහොමයක් සභාවට අහිමි වූ බවත් ඒ අනුව උසාවි දඩ , මුද්දර ගාස්තු වරිපනම් ආදී ආදායම් සභාවට අහිමි වූ බව පෙන්වා දෙන ලදී. මෙවැනි තත්වයක් තුළ වුවත් ප්‍රදේශයේ ජනතාව කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් විශාල වැඩකොටසක් සිදු කළ බව අප කවුරුත් දන්නා කරුණක් බව පවසා සිටියේය. එම නිසා ඒ කාලය තුල සභාවේ කටයුතු නිසි ලෙස සිදු නොවූ බවට අයෙක් චෝදනා කරන්නේ නම් ඒ මෙහි යථාර්තය නිවැරදි ලෙස අවබෝධ කර නොගත් අයෙකු පමණක් බව පවසා සිටියේය. ගරු සභාපතිතුමා තමන්ගේ රාජකාරි කාලය තුළ නිසි ආකාරයෙන් සිය කටයුතු සිදු කළ බවත් නිලධාරීන් සමඟ මෙන්ම බාහිර ප්‍රජාව සමඟත් එතුමාගේ සුහදශීලීත්වය තුළ මේ සභාවේ කාර්යන් මනාව පවත්වාගෙන යාමට හැකියාව ලැබුණු බව පවසා සිටියේය.මේ සභාවේ සම්පත් එතුමා කිසි දිනක සියතට ගෙන පාලනය කිරීමක් සිදු නොකළ බවත් මූල්‍ය තත්ව තත්වය ආරක්ෂා කර ගැනීමටත් හැකි සෑම උත්සාහයක්ම දැරූ බවත් පවසා සිටියේය. කොවිඩ් රෝගය ව්‍යාප්ත වන අවස්ථාවේ එතුමා ඈත ගම් වල වාහනයකින් රෝගීන් රෝහලට ගෙන යාමට නොහැකි ස්ථාන වලට සිය නිල රථයෙන් ගොස් එමඟින් එම රෝගීන් රෝහල කරා යොමු කිරීමට තරම් නිහතමානී වූ බව සිහිපත් කළ එතුමා ගරු සභාපතිතුමාගේ කැපවීම තුළ ඒ ජීවිත බේරා ගැනීමට හැකි වූ බව පවසා සිටියේය. මේ අය වැය කෙටුම්පතේ වියදම් වැඩි බවට විපක්ෂයෙන් චෝදනා එල්ල වූ බවත් මීට වසාර දෙකකට පෙර තිබූ ඉන්ධන මිලත් අද වන විට පවතින ඉන්ධන මිලත් දෙස බැලූ විට සභාවේ කසළ එකතු කිරීමට යොදා ගත් ට්‍රැක්ටර් රථ මෙන්ම අනෙකුත් වාහනද ධාවනය කිරීම සීමා කිරීමට සිදු වී ඇති බව පෙන්වා දෙන ලදී. ඒ අනුව වියදම් දෙස බැලූ විට අනෙකුත් වියදම්ද ඒ ආකාරයෙන්ම විශාල වශයෙන් වැඩි වී ඇති නිසා වියදම් පසු ගිය වර්ෂ හා සැසදීම සිදු කිරීම උචිත නොවන බව පවසා සිටියේය. ඒ ැනුව බැලූ විට ලැබෙන ආදායම අඩු වී වියදම වැඩි වි ඇති කාලයක පවතින බාධක වලට මුහුණ දෙමින් මේ අයවැය සකස් කිරීමට සිදුව ඇති බව පෙන්වා දෙන ලදී. අහිමි වන ආදායම උපයා ගැනීම සඳහා ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම වැනි නව ව්‍යාපෘති කෙරෙහි යොමු වීමට ගරු සභාපතිතුමා ක්‍රියා කර ඇති බව පෙන්වා දුන් එතුමා මේවා කාලීන අවශ්‍යතාවය මත සිදු කරන හොඳ ආයෝජන බව පවසා සිටියේය. වෙනත් මන්ත්‍රීවරුන්ටද අය වැය සම්බන්ධ අදහස් දැක්වීමට අවශ්‍ය නිසා තම කතාව අවසන් කරන බවත් 2023 අය වැය සඳහා තම සහයෝගය ගරු සභාපතිතුමාට පිරිනමන බව පවසමින් සිය කතාව අවසන් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්‍රම් චන්දන මැතිතුමා:**

2023 අය වැය කෙටුම්පතේ සඳහන් දෙහිඕවිට ජාතික පාසල අසල පිහිටි පැරණි සභා ගොඩනැගිල්ලේ වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා රුපියල් ලක්ෂ 20 ක මුදලක් වෙන් කර තිබෙන බවත් එම යෝජනාව පැරණි සභා ගොඩනැගිල්ල පිහිටි භූමියේ පෙර පාසලක් හා දිවා සුරකුම් මධ්‍යස්ථානක් ඉදි කිරීම ලෙස සංශෝධනය කිරීමට යෝජනා කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය:**

එම යෝජනාව ස්ථිර කළාය.

ඒ අනුව 2023 අය  වැය කෙටුම්පතේ සඳහන් දෙහිඕවිට ජාතික පාසල අසල පිහිටි පැරණි සහා ගොඩනැඟිල්ලේ වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමේ යෝජනාව පැරණි සහා ගොඩනැගිල්ල පිහිටි භූමියේ පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානක් ඉදි කිරීම ලෙස සංශෝධනය කිරීම සඳහා මහා සභාවේ එක්මතික අනුමැතිය හිමි විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

වසර 04ක් පුරාවට ගරු සභාපතිතුමා මේ සභාව සඳහා සිදු කරන ලද සේවාව පිළිබඳව බොහෝ මන්ත්‍රීවරුන් කතා කළ බවත් එය සිහිපත් කිරීම අපගේ යුතුකමක් ලෙස තමන් දකින බවත් පවසා සිටියේය. තමන් සභාපතිවරු දෙදෙනෙකු යටතේ මේ සභාව නියෝජනය ක ඇති බවත් පෙර සභා වාර වල මන්ත්‍රීවරුන්ට තිබූ ගෞරවයට සාපේක්ෂව මේ සභා වාරයේ මන්ත්‍රීවරුන් ඇගයීමකට ලක් වීමක් සිදු වූ බව අප සැම පිළිගත යුතු කාරණයක් බව පැවසීය. ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද සංවර්ධන ක්‍රියාවලි සඳහා ගරු සභාපතිතුමා ලබා දුන් සහය අගය කරමින් සිහිපත් කරන බවත් ගරු සභාපතිතුමා මේ තනතුර සඳහා පත් වන විට සභාව පිටුපස ක්‍රීඩාංගනයේ තිබූ කසළ ගොඩවල් නිසි පරිදි ඉවත් කර ඒ ක්‍රීඩාපිටිය භාවිතයට ගත හැකි මට්ටමට ගෙන ඒම අගය කල යුතු බව පවසා සිටියේය. එසේම වර්තමානය වන විට ඉන්ධන පිරවුම්හල් ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට යන සේවයද අගය කළ යුතු කාර්යක් බව පවසා සිටියේය. එසේම ගරු සභාපතිතුමා දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු  නිසි පරිදි කළමනාකරණය කරමින පවත්වාගෙන යෑම අගය කළ යුතු බවත් ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා සහ අප සියළුදෙනාටම එම කසළ අංගනය නිසා ජනතාව පත් වූ අපහසුතා හේතුවෙන් විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදු වූ බවත් එය කළමනාකරණය කර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ස්තූතිවන්ත විය යුතු බවත් පවසා සිටින ලදී. අද දින මේ සභාවේ ගරු මන්ත්‍රීවරියකගේ ඥාති සහෝදරියගේ අවමඟුල් උත්සවයක් තිබෙන බැවින් එතුමියට ඒ සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම සිදු කළ යුතු කාර්යක් බැවින් තම කතාව අවසන් කරන බවත් ගරු සභාපතිතුමා සිදු කළ සේවාව අගයන නමුත් එතුමා නියෝජනය කරන පක්ෂයේ නායකයා මේ රටට සිදු කළ විනාශය හේතුවෙන් අද රට පත්ව ඇති තත්වය සම්බන්ධයෙන් අප්‍රසාදයක් පවතින බව පවසා සිටියේය. අද වන විට මේ රටේ දරුවන් මනද්පෝෂණය හේතුවෙන් අසරණ වී ඇති බවත් ගම්බද පාසල් වල උදෑසන රැස්වීම් වලදී දරුවන් ක්ලාන්ත වී ඇද වැටෙන තත්වයක් උද්ගත වීම කණගාටුවට කරුණක් බව පවසා සිටියේය. මෙලෙස අර්බුදකාරී තත්වයකට පත් රටට ගොඩනැඟීම සඳහා අද වන විට අප පක්ෂයේ නායකයා වන රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සිදු වී තිබීම දෛවෝපගත  සිදු වීමක් බව පැවසීය. මේ අය වැය කෙටුම්පත ක්‍රියාත්මක කළ හොත් මේ ප්‍රදේශයේ ජනතාවට විශාල වශයෙන්  බදු ගෙවීමටත් ඔවුන්ට බදු පැනවීමටත් සිදු වන බැවින් මේ අයවැය කෙටුම්පතට අපගේ විරෝධය ප්‍රකාශ කිරීමට සිදු වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

අද දිනයේ පැවැත්වෙන්නේ මේ සභාවේ 05 වෙනි අය වැය විවාදය බැවින් ඒ සම්බන්ධයෙන් තමන්ටද අදහසක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය බව පවසා සිටියේය. මේ කාලය තුළ ගරු සභාපතිතුමා සිදු කළ සාධනීය කරුණු තිබෙන බවත් එයවික්ටර් බණ්ඩාර මැතිතුමා විසින්ද ප්‍රකාශ කළ බව  පැවසීය. මේ සභාවේ එක් මන්ත්‍රීවරයෙකු ගෝත්‍රික නායකයෙක් හා ජනතාවක් සම්බන්දයෙන් ප්‍රකාශ කළ බවත් තමන්ද එයට එකඟ වන බවත් යම් අයෙක් රත්තරන් පිහියක් පෙන්වා  එයින් ඇන ගන්නා ලෙස පැවසුවහොත අපටද එය සිදු කිරීමට වන බව පවසා සිටියේය. මේ අය වැය කෙටුම්පත අතිශයින් වැරදි සහිත කෙටුම්පතක් බවත් නමුත් ඒවා එකින් එක පෙන්වා දීමට මේ කාලය ප්‍රමාණවත් නොවන බැවින් මෙහි අත්‍යාවශ්‍ය කරුණු කීපයක් පමණක් ගෙනහැර දැක්වීමට අදහස් කළ බව පවසා සිටියේය. 2022 හා 2023 අයවැය කෙටුම්පත් දෙක සංසන්ධනාත්මකව අධ්‍යනය කළහොත් මෙහි ඇත්තේ අංක එහා මෙහා සිදු කිරීමක් පමණක් බව පවසා සිටියේය. ඒ හැර බල ප්‍රදේශයේ ජනතාවට සිදු වූ කිසිදු සහනයක් නොමැති බව පවසා සිටියේය.

ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සහා අරමුදරල් දෙකෝටි විසි ලක්ෂයකට ආසන්න මුදලක් පවතින බවට ප්‍රකාශ වූ බවත් ඒවා මේ බල ප්‍රදේශයේ ජනතා ාවගේ මුදල් බවත් පවසා සිටියේය. එසේ නම් එතරම් මුදලක් ගිණුම්ගත කර තබාගෙන සිටින්නේ ඇයිද යන්න සම්බ්නධයෙන් ගැටළුවක් ඇති වන බව පවසා සිටින ලදී.මේවා ප්‍රදේශයේ දරුවන්ගේ පෝෂණ තත්වය නඟා සිටුවීමේ කාර්යක් සඳහා හෝ යොදා ගැනීමට ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙන ලදී. එසේම 2023 වර්ෂයේ අය වැය කෙටුම්පතේ වැඩසටහන් අංක 02 යටතේ මඟින් දීගලවත්තජල යෝජනා ක්‍රමය සඳහා රුපියල් ලක්ෂ 20 ක මුදලක් වෙන් කර ඇති බවත් එහි පළමු අදියරේ ප්‍රගතිය මේ සභාව නියෝජනය කරන මහජන නියෝජිතයන් සහ නිලධාරීන් ගොස් පරීක්ෂා කර බලන ලෙස ඉල්ලා සිටියේය. එම ව්‍යාපෘතියට අදාල ළිඳ ඉදි කර ඇත්තේ ඇළක් උඩ බවත් එම ළිදේ ජලය කිසිවෙකුට පානය කළ නොහැකි බව පවසා සිටියේය. එසේම ඒ සඳහා අවශ්‍ය බට මිලදී ගැනීම සඳහා යැයි පවසමින් මිල ගණන් පවා වෙනස් කළ බවත් එම නිසා මෙම දීගල වත්ත ජල යෝජනා ක්‍රමය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. මෙනවැනි තත්වයක් යටතේ මේ ගෝත්‍රික සමාජයේ ජීවත් වන තමන්ට මේ අයවැය කෙටුම්පත සඳහා සහය ලබා දිය නොහැකි බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දීගලවත්ත ජල ව්‍යාපෘතිය පළාත් සභාවෙන් රුපියල් ලක්ෂ 20 ක් ලැබුණු ව්‍යාපෘතියක් බවත් එම ස්ථානයේ තිබූ ළිඳක්විශාල කිරීමක් සිදු කළ බවත් වසරකට වඩා පැරණි මෙම කාර්යයෙ ්මුදල් තවමත් අවිච්ඡේද නොවූ බවත් පවසා සිටියේය. එම මුදල ලැබෙන තුරු බලා සිටින බවත් පළාත් සභාවෙන් ඒවා එවන බවට සඳහනක් නොමැති බවත් පැවසූ ගරු සභාපතිතුමා කොන්ත්‍රාත්කරු ගිවිසුම්ගත වී ඇති බව පවසා සිටියේය. මීට අමතරව මේ ඇස්තමේන්තුවේ මුදල් ඉක්මවා යම් මුදලක් කාර්ය සඳහා වැය වන බැවින් ඒ සඳහා සභාවෙන අමතර මුදල අනුමත කරවා ගත් බව පවසා සිටියේය. එසේ වුවත් අදාල මුදල් නොලැබීම මත එය සිදු කිරීම තවමත් ආරම්භ කර නොමැති බව පවසා සිටියේය. පසුගිය සතියේ පළාත් සභාවෙන් විමසූ විට එම මුදල් එවන බවට පැවසූ බවත් මේ සඳහා සකස් කළ ළිද වසරක පමණ කාලයක සිට භාවිතයට ගෙන නැති බැවින් ජල සාම්පල පරීක්ෂා කර මිස ජනතාවට ජලය ලබා නොදෙන බව පවසා සිටියේය. බොහෝ මන්ත්‍රීවරු අය වැය කෙටුම්පත සම්බන්ධව අදහස් දැක්වූ බැවින් බෙදිමක් සඳහා යොමු වීමට අවශ්‍යදැයි විමසා සිටියේය.

බෙදීමක් අවශ්‍ය බවට විපක්ෂය ප්‍රකාශ කළ බැවින් 2023 අයවැය කෙටුම්පත සඳහා ඡන්ද විමසීම ආරම්භ කරන ලදී.

<u>**යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සභිකයින්:**</u>

1. ගරු සභාපති දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා -ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
2. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා. - ස්වාධීන මන්ත්‍රී
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා. - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
9. .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී.නයනා ප්‍රියන්ති මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා වීරක්කොඩි මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

14. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තුෂාර අමරසිරි මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
15. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී සඳමාලි විජේරත්න මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
16. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
17. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
18. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
19. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුධර්මා ලක්මාලි මැතිණිය. - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
20. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ

**<u>යෝජනාවට විරුද්ධ බව ප්‍රකාශ කළ සභිකයින්:</u>**

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය. - එක්සත් ජාතික පක්ෂය
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය. - එක්සත් ජාතික පක්ෂය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල නුවන් ජයවීර මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා. - ස්වාධීන මන්ත්‍රී

**<u>ඡන්දය දීමෙන් වැලකී සිටි සභිකයින්:</u>**

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය

**<u>ඡන්දය විමසන අවස්ථාවේදී සභාවේ නොසිටි සභිකයින්</u>**

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය - එක්සත් ජාතික පක්ෂය

ඒ අනුව 2023 ජනවාරි මස 01 වෙනි දිනෙන් පටන් ගෙන එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදායම් ඒකරාශීකරණය සහ වියදම් දැරීම පිණිස වූ " කෙටුම්පත් අය වැය ලේඛනය" වැඩි ඡන්ද 09 කින් සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම හා වෙනත් දිනයක් නියම කිරීම:**

2022.09.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා,2022.09.21 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව,2022.09.21 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව, 2022.09.21 දින පැවති කාර්මික හා සේවා කාරක සභා වාර්තාව සලකා බලන ලදී.

(උ) 2022 සැප්තැම්බර් මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව හා වියදම් විස්තරය, 2022 තුන් වන කාර්තුවේ ආදායම් සහ වියදම් සාරාංශ සලකා බලන ලදී

**(ඍ) වෙනත් කරුණු:** නැත

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 අය වැය කෙටුම්පත සඳහා සහය ලබා දුන් සියළුම මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට සිය ස්තූතිය පිරිනමන බවත්, නිවැරදි විය යුතු කරුණු පෙන්වා දීම සම්බන්දයෙන් පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වන බවත් පැවසීය. මේ සියළු කාර්යන් ක්‍රියාත්මක කිරීම සඳහා තමන් කොරෙහි තැබූ විශ්වාසය සම්බන්ධයෙන් කෘතාඥ වන අතර ඒවා සඳහා අවශ්‍ය සහය ඉදිරියේදීත් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන බව පවසා සිටින ලදී. දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බැවින් සහ අද දිනයේ සහෝදර මන්ත්‍රීවරියකගේ ඥාතී සහෝදරියගේ අවමංගල්‍යයක් පැවැත්වෙන බැවින් ඒ සඳහා මන්ත්‍රීවරුන්ට සහභාගී වීමට අවස්ථාව ලබා දෙමින් සභාවේ කටයුතු අවසන් කරන බවත් මී ළග මහා සභා රැස්වීම 2022 නොවැම්බර් මස 08 වෙනි දින පෙ:ව: 09.30 ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වෙන බව පවසමින් එදින රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.